CM 36675 (S) / T-02/ 2nd reading NR

2021 වාර්ෂික කාර්යසාධන වාර්තාව

ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව

වැය විෂය අංකය : 233

අංක 31, ඉසුරු මාවත,
පැලවත්ත, බත්තරමුල්ල
www.analyst.gov.lk
govanalyst@sltnet.lk

ගෞරි රමනා
ආණ්ඩුවේ රස පරීක්ෂක

පටුන

පිටු අංකය

පරිච්ඡේදය 01 - ආයතනික තොරතුරු 01

1.1 හැඳින්වීම 01
1.2 දෙපාර්තමේන්තුවේ දැක්ම, මෙහෙවර හා අරමුණු 02
1.3 ප්‍රධාන කාර්යයන් 03
1.4 දෙපාර්තමේන්තුවේ සංවිධාන ව්‍යුහය 04
1.5 දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ 05
1.6 විදේශ අරමුදල් සහිත ව්‍යාපෘතියේ විස්තර 08

පරිච්ඡේදය 02 - දෙපාර්තමේන්තුවේ කාර්යසාධනය 09

පරිච්ඡේදය 03 – 2021.12.31 දිනට සමස්ත මූල්‍ය කාර්යසාධනය 13

3.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය 13
3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය 15
3.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය 16
3.4 මූල්‍ය ප්‍රකාශනවලට සටහන් 17
3.5 ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය 18
3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගි කර ගැනීමේ කාර්යසාධනය 18
3.7 මු.රෙ. 208 අනුව ප්‍රතිපාදන පැවරීම 18
3.8 මූල්‍යමය නොවන වත්කම් වාර්තා කිරීම සම්බන්ධ ප්‍රගතිය 18
3.9 විගණකාධිපති වාර්තාව 19

පරිච්ඡේදය 04 - කාර්යසාධන ඉලක්ක 27

පරිච්ඡේදය 05 - සුහුරු සංවර්ධන ඉලක්ක 28

පරිච්ඡේදය 06 - මානව සම්පත් කළමනාකරණය 29

6.1 කාර්ය මණ්ඩල කළමනාකරණය 29
6.2 කාර්ය මණ්ඩල ඌණතා හා අතිරික්ත 29
6.3 මානව සම්පත් කළමනාකරණය 31

පරිච්ඡේදය 07 - අනුකූලතා වාර්තාව 33

01 පරිච්ඡේදය

ආයතනික තොරතුරු

1.1 හැඳින්වීම

වර්ෂ 1904 සැප්තැම්බර් මාසයේ ලංකා වෛද්‍ය විද්‍යාලයට අනුබද්ධිතව එක් නිලධාරියෙකු සමඟ ආරම්භ කරනු ලැබූ ආණ්ඩුවේ රස පරීක්ෂක ආයතනයේ ප්‍රථම රස පරීක්ෂකවරයා ලෙස බ්‍රිතාන්‍ය ජාතික කේ. සී. බ්‍රවුනින් මහතා ඉතිහාසයට එක්වේ.

ශ්‍රී ලංකා වෛද්‍ය විද්‍යාලයට අනුබද්ධිතව පැවති මෙම ආයතනය වසර 1913දී රජයේ දෙපාර්තමේන්තුවක් ලෙස ස්ථාපිත විය. දෙපාර්තමේන්තුවක් ලෙස විකාශනය වෙමින් පැවැති මෙම ආයතනය, වර්ෂ 1934 දී ස්වදේශ කටයුතු අමාත්‍යාංශය යටතේ කොළඹ 07, නිදහස් චතුරස්‍රයේ පැවැති ගොඩනැගිල්ලක ප්‍රතිස්ථාපනය කරන ලදී.

ආරම්භයේ සිටම විදේශීය ප්‍රධානීන් යටතේ පැවැති මෙම දෙපාර්තමේන්තුවේ ප්‍රථම ශ්‍රී ලාංකික රස පරීක්ෂකවරයා ලෙස ඩබ්.ආර්. චන්මුගම් මහතා 1945 දී පත්විය. ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ කාර්යයන් පුළුල් කරමින් 1935දී සැක කටයුතු ලේඛන පරීක්ෂා කිරීමේ කටයුතු ආරම්භ කරන ලද අතර 1940දී ප්‍රථම සැක කටයුතු ලේඛන පිළිබඳ ආණ්ඩුවේ පරීක්ෂක ලෙස තම්බයියා නාගේන්ද්‍රන් මහතා පත්විය.

වර්ෂ 1960දී ආරක්ෂක අමාත්‍යාංශය යටතේත්, 1978 දී අධිකරණ අමාත්‍යාංශය යටතේත් ක්‍රියාත්මක වෙමින් පැවැති මෙහි ප්‍රථම කාන්තා රස පරීක්ෂකවරිය ලෙස 1993 දී යෝගරාණී මහේසන් මහත්මිය ඉතිහාසයට එක්විය.

විද්‍යාගාරයක් සඳහා උචිත නොවන ගොඩනැගිල්ලක ගැටලු රාශියකට මුහුණ දෙමින් වර්ෂ සියයකට අධික කාලයක් කොළඹ නිදහස් චතුරස්‍රයේ පැරණි ගොඩනැගිල්ලක පැවැති රස පරීක්ෂක දෙපාර්තමේන්තුව, 2013 වසරේදී බත්තරමුල්ල, පැලවත්තේ කරන ලද මහල් 06ක් සහිත නව විද්‍යාගාර හා කාර්යාල සංකීර්ණයකින් සමන්විත නව ගොඩනැගිල්ලක ස්ථාපිත කරන ලදී.

නවීන අංගෝපාංග වලින් සමන්විත නව විද්‍යාගාරය ස්ථාපිත කිරීම හා සමගාමීව නව තාක්ෂණ ක්‍රමවේද හඳුන්වාදීමට හැකිවීම, අපරාධ යුක්තිය ඉටුකිරීම සඳහා අවශ්‍ය විද්‍යාත්මක විශ්ලේෂණ කාර්යක්ෂම ලෙස ඉටුකිරීමට මහඟු පිටිවහලක් විය.

එසේම යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලියට දායක වීමේදී අධිකරණ විද්‍යා අංශයට අත්‍යවශ්‍යව පැවැති DNA තාක්ෂණය මෙරටෙහි ස්ථාපිත කිරීමෙහිලා ශ්‍රී ලංකා රජය හා USAID ව්‍යාපෘතිය හා එක්ව DNA විද්‍යාගාරයක් 2013 වර්ෂයේදී රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ නව ගොඩනැගිල්ලෙහි ආරම්භ කරන ලදී.

2016දී ආරම්භ කරන ලද කොරියානු ජාත්‍යන්තර සහයෝගිතා ආයතනය (KOICA) මඟින් ප්‍රදානය කරන ලද ව්‍යාපෘතිය මඟින් දෙපාර්තමේන්තුවේ DNA විද්‍යාගාරය වැඩිදියුණු කිරීමත්, ශ්‍රී ලංකාව තුළ ප්‍රථම වරට පරිගණක අපරාධ විමර්ශන විද්‍යාගාරයක් රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ ස්ථාපිත කිරීමත්, දෙපාර්තමේන්තුව මඟින් අපරාධ යුක්තිය පසිඳලීම සඳහා සපයන විද්‍යාත්මක සාක්ෂි, තවදුරටත් සඵලදායී කිරීම සඳහා ලැබුණු සුවිශේෂී පියවරකි.

මේ අයුරින් ලබාගන්නා ලද විද්‍යාත්මක විශ්ලේෂණවල ඉහළ ගුණාත්මකභාවය තුළින් 2016 වසරේදී රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ විද්‍යාගාර සඳහා ISO 17025 අන්තර්ජාතික ප්‍රතිතකරණය ලබාගත හැකි විය. වර්ෂ 1904 දී එක් නිලධාරියෙකුගෙන් ආරම්භ කළ මෙම දෙපාර්තමේන්තුවේ මේ වන විට 21 වන රස පරීක්ෂකවරිය ලෙස ජී. රමනා මහත්මිය පත්වී ඇති අතර 6 වන සැක කටයුතු ලේඛන පරීක්ෂක ලෙස එස්. ඒ. බටකන්දගේ මහතා පත්වී ඇත.

අද වන විට විද්‍යාත්මක නිලධාරීන් 100ක් සේවය කරන අතර අධිකරණ විද්‍යා හා ආහාර විද්‍යා යන ප්‍රධාන ක්ෂේත්‍ර දෙක යටතේ ක්‍රියාත්මක වන රස පරීක්ෂක දෙපාර්තමේන්තුව නිහඬව වූද, අභිමානවූත් සේවයක් ඉටුකරනු ලබයි.

1.2 දෙපාර්තමේන්තුවේ දැක්ම, මෙහෙවර හා අරමුණු



1.3 ප්‍රධාන කාර්යයන්

ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව අධිකරණ විද්‍යා අංශය සහ ආහාර විද්‍යා අංශය යන ප්‍රධාන අංශ දෙකකින් සමන්විත වන අතර එය ශ්‍රී ලංකාවේ ඇති එකම රජයේ අධිකරණ විද්‍යා විද්‍යාගාරය වේ. ගිනි අවි හා ප්‍රක්ෂිප්ත විද්‍යා, පුපුරණ ද්‍රව්‍ය හා ගිණි විමර්ශන, මත්ද්‍රව්‍ය හා මනෝවර්තක අංශය, මස්තු විද්‍යා හා DNA, ධූලක විද්‍යා, සැකකටයුතු ලේඛන, පරිගණක ඩිජිටල් අපරාධ විමර්ශන අංශය සහ විවිධ නඩු අංශය යනුවෙන් ප්‍රධාන අංශ අටකින් අධිකරණ විද්‍යා අංශය සමන්විත වේ.

මෙම දෙපාර්තමේන්තුව සේවාවන් සඳහා වෙන්වූ ආයතනයක් වන අතර, අධිකරණ, පොලිස් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා රේගුව, සුරාබදු දෙපාර්තමේන්තුව, පළාත් පාලන ආයතන, සෞඛ්‍ය දෙපාර්තමේන්තුව, වරාය අධිකාරිය හා වෙනත් රජයේ දෙපාර්තමේන්තු සහ ව්‍යවස්ථාපිත ආයතන මඟින් යොමු කරනු ලබන නඩු භාණ්ඩ හා වෙනත් ආදර්ශ හා සාම්පල් විද්‍යාත්මක පරීක්ෂණයන්ට භාජනය කර විශ්ලේෂණ වාර්තා නිකුත් කිරීම සිදුකරනු ලබයි. මීට අමතරව විවිධ රාජ්‍ය දෙපාර්තමේන්තු සහ රාජ්‍ය අනුග්‍රහය ලබන ආයතන මඟින් ඉදිරිපත් කරනු ලබන ආහාර, මත්පැන්, කිරි හා ජලය ආශ්‍රිත ආදර්ශවල තත්ත්වය පරීක්ෂා කර වාර්තා ලබාදීම සිදු කෙරෙනු ලබයි. තවද අධිකරණ මඟින් ඉදිරිපත් කරනු ලබන සැක සහිත ලේඛන පරීක්ෂා කර වාර්තා කිරීම සැක කටයුතු ලේඛන අංශය මඟින් කරනු ලබයි.

පරීක්ෂණ සඳහා ඉදිරිපත් කරනු ලබන සියලුම නඩු භාණ්ඩ හෝ වෙනත් ආදර්ශ, ආහාර හා ඖෂධ පනත, ජාතික පාරිසරික පනත, සුරාබදු ආඥාපනත, දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරී පනත, සුවඳ විලවුන් උපකරණ හා ඖෂධ පනත, පළිබෝධනාශක පාලනය කිරීමේ පනත, ගිණිඅවි ආඥාපනත, පුපුරන ද්‍රව්‍ය ආඥාපනත, විෂ වර්ග, අබිං සහ අන්තරායකර ඖෂධ පනත, මෝටර් වාහන පනත, අපරාධ නඩු විධාන සංග්‍රහය, සිවිල් නඩු විධාන අංශය, සාක්ෂි ආඥාපනත වැනි විවිධ අණ පනත් යටතේ පරීක්ෂණයන්ට භාජනය කර වාර්තා නිකුත් කිරීම මෙම දෙපාර්තමේන්තුවෙන් සිදු කෙරේ.

තවද දිවයිනේ සිදුවන මිනී මැරුම්, ස්ත්‍රී දූෂණ, වෙඩි තැබීම්, පිපිරීම්, ගිනි ගැනීම්, මාරක රිය අනතුරු ආදී දරුණු ගණයේ අපරාධ හා සම්බන්ධ අපරාධ ස්ථාන විමර්ශනයන් සඳහා නිලධාරීන්ගේ විශේෂඥ සහාය පොලිස් දෙපාර්තමේන්තුව වෙත ලබාදේ. මීට අමතරව ප්‍රභූ රාජ්‍ය තාන්ත්‍රිකයන් සඳහා ආහාර පරීක්ෂාව සිදු කරනු ලබන්නේ ධූලක විද්‍යා (වස විෂ) අංශය මඟිනි.

අධිකරණයේ විශේෂඥ සාක්ෂිකරුවන් ලෙස රස පරීක්ෂක දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කරන ලද රස පරීක්ෂණ වාර්තා සම්බන්ධයෙන් අප නිලධාරීන් දිවයිනේ විවිධ අධිකරණවලදී විශේෂඥ සාක්ෂි ලබාදෙති.

මෙවැනි සේවා සැපයීමට අමතරව විවිධ ක්ෂේත්‍රවල නිපුණතා ලබා ඇති විශේෂඥ නිලධාරීන් විසින් රාජ්‍ය අනුග්‍රහය ලබන ආයතනවලට විද්‍යාත්මක උපදේශනයන්ද ලබාදීම සිදුකරයි. විශේෂයෙන්ම ආහාර පනත යටතේ සාදනු ලබන රෙගුලාසි සහ ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ විවිධ ප්‍රමිති පිරිවිතර සැදීමේදී මෙම නිලධාරීන්ගෙන් විශාල දායකත්වයක් ලබාදෙයි. ආරක්ෂක අමාත්‍යාංශයට අවශ්‍ය ආයුධ හා උපකරණ හා පුපුරන ද්‍රව්‍ය හා වෙනත් රසායන ද්‍රව්‍ය මිලදී ගැනීම් වලදී සහ වෙනත් ආයතනවල අධි තාක්ෂණික උපකරණ මිලදී ගැනීම්වලදී තාක්ෂණික කමිටු වලට විශේෂඥ සහාය ලබාදීමද මෙම නිලධාරීන් විසින් සිදුකරනු ලැබේ.

තවද පොලිස් නිලධාරීන්, අපරාධ පරීක්ෂණ නිලධාරීන්, ත්‍රිවිධ හමුදා නිලධාරීන්, නීතිපති දෙපාර්තමේන්තුවේ ආධුනික නීතීඥයන්ට හා අධිකරණ වෛද්‍ය නිලධාරීන් මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් සඳහා ඔවුන්ගේ අධිකරණ විද්‍යාත්මක හා ආහාර විද්‍යාත්මක දැනුම ප්‍රවර්ධනය සඳහා අප නිලධාරීන් විසින් දේශන පවත්වනු ලබයි.

1.4 දෙපාර්තමේන්තුවේ සංවිධාන ව්‍යුහය



1.5 දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ

<u>අධිකරණ විද්‍යා ක්ෂේත්‍රය</u>

1. ගිනිඅවි සහ ප්‍රක්ෂිප්ත විද්‍යාව

ගිනිඅවි සහ අධිකරණ ප්‍රක්ෂිප්ත විද්‍යා අංශය විසින් විවිධ වර්ගයේ ගිනිඅවි එනම් රයිපල, පිස්තෝල, පතරොම්, තුවක්කු, කොටන තුවක්කු සහ පතරොම් වර්ග ළඟ තබා ගැනීමකදී, මේවා අපරාධ යොදා ගත් බවට සැක කරන අවස්ථාවලදී ඒවා පරීක්ෂා කර වාර්තා නිකුත් කරනු ලබයි. ගිනිඅවි භාවිතා කොට සිදු කරනු ලබන අපරාධ පිළිබඳව අන්වීක්ෂීය සැසඳුම් පරීක්ෂණ සිදුකරමින් විද්‍යාත්මකව විමර්ශනය කිරීම මීට ඇතුළත් වේ. ඒ සඳහා අපරාධවලදී භාවිතා කරන ලද ගිනිඅවි, ගිනිඅවි වල කොටස්, විවිධ පතරොම් වර්ග, වැයවූ පතරොම් කොපු හා උණ්ඩ ආදිය පරීක්ෂා කරනු ලැබේ. තවද වෙඩි තැබීම්වලට ලක්වූ මෝටර් රථ, ගොඩනැගිලි ආදියද පරීක්ෂාවට ලක්කරන අතර කුමන ගිනි අවියක් අදාළ අපරාධ සඳහා භාවිතා කළේද යන්න පිළිබඳ විශේෂඥ මතයන් ඉදිරිපත් කරනු ලැබේ.

2. පුපුරන ද්‍රව්‍ය සහ ගිනි විමර්ශනය

මෙම අංශය මඟින් බෝම්බ පිපිරීම්, පුපුරන ද්‍රව්‍ය හා පිපිරුම් උපක්‍රම (බෝම්බ) යමෙක් තම සන්තකයේ තබා ගැනීම් ඇතුළු පුපුරන ද්‍රව්‍ය භාවිතා කර සිදුකරන අපරාධවලට අදාළ නඩු භාණ්ඩ විද්‍යාත්මක පරීක්ෂාවට භාජනය කරනු ලැබේ. සන්තකයේ තබා ගැනීමේදී අත්අඩංගුවට ගන්නා ලද විවිධ වර්ගයේ පිපිරුම් උපක්‍රම (දේශීය හා විදේශීයව) නිෂ්ක්‍රීය කිරීමෙන් පසු, ඒවායේ කොටස්ද මෙම නිලධාරීන් විසින් විශ්ලේෂණයට භාජනය කරනු ලබයි. එමෙන්ම දේපළ, ගොඩනැගිලි හා වාහන ආදිය ගිනිගැනීම්වලදී පොලීසියට කරනු ලබන පැමිණිලි හා රක්ෂණ වන්දි සඳහා කරනු ලබන ඉල්ලීම අනුව එම ගිනි ගැනීම් පිළිබඳව විමර්ශනය කර ගිනි ගැනීමට හේතුව සම්බන්ධයෙන් මතයන් ඉදිරිපත් කිරීමද මෙම අංශයේ නිලධාරීන්ගේ කාර්යයට අදාළ වේ.

3. මත්ද්‍රව්‍ය හා මනෝවර්තන

පොලීසිය, මත්ද්‍රව්‍ය කාර්යාංශය හෝ රේගුව විසින් අල්ලා ගනු ලබන තහනම් මත්ද්‍රව්‍ය හා මනෝවර්තක ද්‍රව්‍ය වන හෙරොයින්, කොකේන්, ගංජා සහ විවිධ මත්පෙති යනාදිය රසායනිකව හඳුනා ගැනීම හා ඒවායේ අඩංගු ක්‍රියාකාරී සංඝටක වල සංශුද්ධතාවය විශ්ලේෂණය කර අධිකරණය වෙත වාර්තා කිරීම මෙම අංශය මඟින් සිදු කරයි.

4. අධිකරණ මස්තු විද්‍යා සහ ඩී.එන්.ඒ

විවිධ දරුණු අපරාධ සම්බන්ධයෙන් සාක්ෂි වශයෙන් ලබා ගන්නා ජීව විද්‍යාත්මක ද්‍රව්‍යය මෙන්ම, ජීව විද්‍යාත්මක මව, පියා සහ දරුවන් යන මෙම පාර්ශ්ව අතර සම්බන්ධතාවය ලබා ගැනීම සඳහා මිනිස් ශරීරයේ අස්ථි කැබැලි, දත් හා ශාරීරික තරල ඇතුළු ඕනෑම ජීව විද්‍යාත්මක ද්‍රව්‍යයක් අනුසාරයෙන් පරීක්ෂණ කටයුතු සිදු කර, ඩී.එන්.ඒ තාක්ෂණය ආශ්‍රයෙන් වාර්තා නිකුත් කිරීම මෙම අංශයේ ප්‍රධාන කාර්යභාරය වේ.

එමෙන්ම සංකීර්ණ මිනීමැරුම් සහ අපරාධ ස්ථාන වල වූ රුධිර පැල්ලම්, කෙස්, ලේ විසිරීම් රටා, කෙඳි සිරීම් සලකුණු ආදී ජීව විද්‍යාත්මක භෞතික සාක්ෂි පරීක්ෂා කර, විශ්ලේෂණයෙන් අනතුරුව වාර්තා නිකුත් කිරීමද මෙම අංශයේ රාජකාරීවලට අයත් වේ.

මීට අමතරව වාහන අනතුරුවලට අදාළ වන වාහන අනතුරු වූ ස්ථාන සහ අදාළ අනෙකුත් සාක්ෂි විද්‍යාත්මකව පරීක්ෂා කර එම අනතුරු ප්‍රති නිර්මාණය කර අවශ්‍ය වැදගත් සාක්ෂි සොයා ගැනීම මෙම අංශයේ විශේෂඥයින්ගේ වගකීමකි.

5. අධිකරණ ධූලක විද්‍යාව

අධිකරණ ධූලක විද්‍යා අංශයේ සිටින විශේෂඥයන් විසින් අධිකරණ වෛද්‍ය කාර්යයන් හා අපරාධ විමර්ශන සඳහා වස වර්ග හඳුනා ගැනීම පිණිස විශ්ලේෂණ කටයුතු රාශියක් සිදු කරනු ලැබේ. අධිකරණ වෛද්‍ය නිලධාරීන් විසින් හෝ අධිකරණය විසින් භාරදෙනු ලබන සැක සහිත සහ හදිසි මරණවලට භාජනය වූ තැනැත්තන්ගේ පශ්චාත් මරණ පරීක්ෂණවලදී ලබාගත් ශරීර කොටස් හා ආදර්ශ, මත්ද්‍රව්‍ය සහ අනෙකුත් වස වර්ග වන සයනයිඩ්, පලිබෝධ නාශක වර්ග, විඛාදක අම්ල වර්ග සහ කාබන් මොනොක්සයිඩ් වැනි අහිතකර රසායනික ද්‍රව්‍ය හඳුනා ගැනීම සඳහා විශ්ලේෂණය කිරීම, බීමත්ව රිය පැදවීම සැක කරන අවස්ථාවලදී සහ මාරක රිය අනතුරුවලදී මත්පැන් හෝ වෙනත් ඖෂධ භාවිතා කර තිබේදැයි හඳුනා ගැනීම සඳහා පුද්ගලයින්ගේ රුධිරය සහ මූත්‍රා සාම්පල විශ්ලේෂණය කිරීම, අපරාධ ස්ථානයෙන් සොයාගත් අධිකරණ විද්‍යාත්මකව වැදගත් භෞතික සාක්ෂි (ඖෂධ පෙති, වස බෝතල, ඉතිරි වූ ආහාර ද්‍රව්‍ය ආදිය) ද මත්ද්‍රව්‍ය, විෂ වර්ග සහ අම්ල වර්ග හඳුනා ගැනීම සඳහා රසායනික විශ්ලේෂණ මෙම අංශය මඟින් සිදුකෙරේ.

6. අධිකරණ විද්‍යාත්මක සැකකටයුතු ලේඛන

අධිකරණමය හා නීතිමය කටයුතු සඳහා අවශ්‍ය වන සැක සහිත ලිපි ලේඛන මෙම අංශය මඟින් පරීක්ෂාවන්ට ලක්කෙරේ.

සියලු වර්ගවල සැක කටයුතු ලේඛන, අත්අකුරු සහ අත්සන් ආදිය, මෙම අංශයේදී ඒවායේ නිර්ව්‍යාජභාවය සඳහා පරීක්ෂා කරනු ලැබේ. තවද ලේඛනවල තිබෙන වෙනස් කිරීම්, මැකීම්, විකෘති කිරීම්, එකතු කිරීම් සහ ආදේශ කිරීම් ආදිය හඳුනාගැනීම, ගමන් බලපත්‍ර, වීසා, ලිවීමේ උපකරණ, තීන්ත, කඩදාසි සහ අලවන ද්‍රව්‍ය, පිළිස්සුණු සහ විකෘති කරන ලද ලේඛන, ව්‍යාජ මුදල් නෝට්ටු, ලොතරැයිපත්, ආදායම් මුද්දර, තැපැල් මුද්දර සහ (රජයේ) ආදායමට සම්බන්ධ වෙනත් යම් ලේඛන පරීක්ෂා කර ඒවායේ නිර්ව්‍යාජ බව හෝ අදාළ වෙනත් මතයන් අදාළ ආයතන වෙත ඉදිරිපත් කිරීම මෙම අංශයේ විශේෂඥ නිලධාරීන්ගේ වගකීම වේ.

7. පරිගණක හා ඩිජිටල් අපරාධ විශ්ලේෂණ විද්‍යාගාරය

මෑතකදී ස්ථාපිත කර ඇති ඩිජිටල් අපරාධ විශ්ලේෂණ අංශය මූලික ලෙස ඩිජිටල් දත්ත විශ්ලේෂණය, ඩිජිටල් ඡායාරූප විශ්ලේෂණය, කටහඬ හා ශබ්ද විශ්ලේෂණය හා ජීවමිතික ලක්ෂණ විශ්ලේෂණය යන මූලික අංශ 4ක් යටතේ විශ්ලේෂණ කටයුතු සිදුකරනු ලබයි.

පරිගණක, ජංගම දුරකථන, CCTV DVR යන්ත්‍ර ආදී ඩිජිටල් උපාංග තුළ අන්තර්ගත දත්ත විශ්ලේෂණය හා ඒවායේ මකා දමා ඇති දත්ත ප්‍රතිඵත්පාදනය, CCTV වීඩියෝ දත්ත විශ්ලේෂණය, ජීවමිතික ලක්ෂණ ඇසුරින් CCTV දර්ශන වල පෙනීසිටින පුද්ගලයින්ගේ මුහුණු හඳුනා ගැනීම, CCTV දර්ශනවල ඇතුළත් අපැහැදිලි වාහන ලියාපදිංචි අංක තහඩු හඳුනා ගැනීම, ඩිජිටල් ඡායාරූප හා වීඩියෝ පට වැඩිදියුණු කිරීම විශ්ලේෂණය හා වෙනස් කිරීම්වලට ලක්කර ඇතිද යන්න හඳුනා ගැනීම, කටහඬ විශ්ලේෂණය මගින් පටිගත කරන ලද සංවාදයන්හි කටහඬහි අනන්‍යතාවය තහවුරු කිරීම ආදී විශ්ලේෂණ මෙහිදී සිදු කරයි.

8. විවිධ අපරාධ

විවිධ අංශයේ සිටින අධිකරණ විද්‍යා විශේෂඥයින් විසින් අනිකුත් විෂයයන් යටතේ නිශ්චිතව වර්ගීකරණය කිරීමට නොහැකි අන්‍යාකාර වූ භෞතික සාක්ෂි පරීක්ෂාවට භාජන කරනු ලැබේ. සැක කටයුතු වාහනවල චැසි අංක සහ එන්ජින් අංක පරීක්ෂා කිරීම සහ ඒවා සත්‍යද, වංචනිකද, යන්න නිගමනය කිරීම හා බද්ධ කරන ලද වාහන හඳුනා ගැනීම එක් උදාහරණයකි. තවද අපරාධවලට සම්බන්ධ විවිධ වර්ගයේ ස්පර්ශ සාක්ෂි හා භෞතික සාක්ෂි *උදා*: වීදුරු කැබලි, තීන්ත පතුරු, කෙඳි වර්ග, පස්, ආයුධ, ආයුධ සලකුණු (ඇහිලි සලකුණු හැර), ලාංඡන ආදිය සඳහා විද්‍යාත්මක පරීක්ෂණ හා විවිධ තාක්ෂණික රසායන උපකරණ භාවිතා කරමින් රසායනික විශ්ලේෂණ ක්‍රම මගින් හඳුනා ගැනීම සහ සංසන්දනය මෙම අංශය මගින් සිදු කරනු ලැබේ.

ආහාර විද්‍යා ක්ෂේත්‍රය

1. ආහාර විද්‍යාගාරය

1980 අංක 26 දරන ආහාර පනත යටතේ සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ බලයලත් නිලධාරීන් (සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන්, ආහාර පරීක්ෂකවරුන්, මහජන සෞඛ්‍ය පරීක්ෂක නිලධාරීන් ආදිය) විසින් ඉදිරිපත් කරනු ලබන ආහාර සාම්පල, කිරි හා කිරි ආශ්‍රිත නිෂ්පාදන, විශ්ලේෂණය කර වාර්තා නිකුත් කිරීම, ආහාර පාලන ඒකකය මගින්, අනෙකුත් රජයේ ආයතන මගින් සහ පුද්ගලික ආයතන මගින් එවනු ලබන එවැනි ආහාර සාම්පල, විශ්ලේෂණය කර තත්ත්ව වාර්තා නිකුත් කිරීම හා රේගු දෙපාර්තමේන්තුව, පාරිභෝගික කටයුතු අධිකාරිය, ශ්‍රී ලංකා තේ මණ්ඩලය සහ ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය ආදිය විසින් ඉදිරිපත් කරනු ලබන සාම්පල විශ්ලේෂණය කර වාර්තා නිකුත් කිරීම, ජාතික පාරිසරික පනත යටතේ ආණ්ඩුවේ විවිධ ආයතන සහ සංස්ථා සඳහා පානීය ජලය සහ කර්මාන්ත අප ජලය විශ්ලේෂණය කර තත්ත්ව වාර්තා නිකුත් කිරීම.

2. මද්‍යසාර විද්‍යාගාරය

අධිකරණය මගින් විශ්ලේෂණය සඳහා අප දෙපාර්තමේන්තුව වෙත එවනු ලබන නීති විරෝධී මත්පැන් සහ දුම්කොළ නිෂ්පාදන විශ්ලේෂණය කර සුරා බදු ආඥාපනත යටතේ අධිකරණය වෙත වාර්තා නිකුත් කිරීම සහ සුරාබදු දෙපාර්තමේන්තුව මගින් ඉදිරිපත් කරනු ලබන දේශීය සහ විදේශීය මත්පැන් සඳහා තත්ත්ව වාර්තා නිකුත් කිරීම මෙම අංශය මගින් සිදු කරනු ලබයි.

සුරාබදු දෙපාර්තමේන්තුව දේශීය හා විදේශීය මත්පැන් සඳහා බලපත්‍ර නිකුත් කිරීමේදී අදාළ මත්පැන් සාම්පල මෙම අංශයට යොමු කර තත්ත්ව වාර්තාවක් ලබාගන්නා ලද අතර, ඒම විශ්ලේෂණ කටයුතු සඳහා අයකිරීමක් සිදුකර එම මුදල රාජ්‍ය භාණ්ඩාගාරය වෙත බැර කරනු ලබයි.

ගිණුම් අංශය

දෙපාර්තමේන්තුවේ මුඛ්‍ය පරමාර්ථය වන කාර්යක්ෂම හා සාධාරණ ලෙස යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලියට දායක වීම සඳහා අවශ්‍ය සම්පත් සහ යටිතල පහසුකම් සැපයීමට අවශ්‍ය වන අරමුදල් රැස්කිරීම සහ ඒවා කාර්යක්ෂමව, ඵලදායී සහ ආර්ථිකමය වශයෙන් මෙහෙයවීම තුළින් මුල්‍ය කළමනාකරණය කිරීම හා ඊට සම්බන්ධ ගිණුම් කටයුතු පවත්වාගෙන යාමද, මුල්‍ය තොරතුරු අවශ්‍ය වෙනත් පාර්ශ්වයන් වෙත ලබාදීමද මුල්‍ය අංශයේ වගකීම වේ.

එම කටයුතු කර ගෙන යාමේදී,

- කාර්යක්ෂම හා සඵලදායක මුල්‍ය කළමනාකරණ පද්ධතියක් ක්‍රියාත්මක කිරීම.
- මුල්‍ය උපදෙස් හා මග පෙන්වීම
- ආයතනය සතු වත්කම්වල ආරක්ෂාව තහවුරු කිරීම
- රාජ්‍ය මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ විධිවිධානවලට අනුකූලව මුල්‍ය පරිහරණය කිරීම
- ගිණුම්කරණය හා වාර්තා කිරීම යනාදී කටයුතු කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරනු ලබයි.

ආයතන අංශය

පුහුණු හා කාර්යක්ෂම මානව සම්පතක් ලබාදීම, සහතික කිරීම, කාර්යක්ෂම හා සාධාරණ ලෙස යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලියට දායකවීමේදී අවශ්‍ය පහසුකම් සැපයීම හා අනෙකුත් සම්බන්ධීකරණ කටයුතුද මෙම අංශයෙන් සිදුකරයි. ඒ යටතේ අවශ්‍ය කරන කාර්ය මණ්ඩලය අනුමත කරවා ගැනීම, පුහුණු කිරීම, ස්ථාන මාරු කිරීම, උසස් කිරීම හා විනය පාලන කටයුතු, අතිකාල, ගමන් වියදම් හා අවශ්‍ය අවස්ථාවන්හිදී පරිපාලනයට අදාළ අභ්‍යන්තර චක්‍රලේඛ නිකුත් කිරීම මෙම අංශයෙන් ඉටු කරනු ලබයි.

1.6 විදේශ අරමුදල් සහිත ව්‍යාපෘතියේ විස්තර

ව්‍යාපෘතියේ නම	ප්‍රදානය කරන රට	ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තු ගත මුදල	ව්‍යාපෘතියේ කාලය
● ශ්‍රී ලංකාවේ අපරාධ යුක්ති විනිශ්චය පද්ධතිය තුළ අධිකරණ වෛද්‍ය ඖෂධ විශ්ලේෂණයේ ධාරිතා ගොඩනැගීම ශක්තිමත් කිරීම	කොයිකා (කොරියාව)	ඇ.ඩො.මි. 4	2022-2025
● එක්සත් ජනපද සහායක	එක්සත් ජනපද තානාපති කාර්යාලය	ඇ.ඩො. 492,000	2021-2022
● ප්‍රති අපරාධ ව්‍යාපෘතිය මත්ද්‍රව්‍ය නාශක ව්‍යාපෘතිය	UNODC/EU/Interpol	-	2021-2022

02 පරිච්ඡේදය

කාර්යසාධනය සහ අනාගත අභියෝග

විශ්ලේෂණ වාර්තාවල ප්‍රගතිය

වාර්තා වී ඇති නඩු සංඛ්‍යාව යුක්තිය පසිඳලීමට දායක වන ප්‍රගතිය මැන බැලීමකි. 2021 වර්ෂය තුළ වාර්තා වූ නඩු සංඛ්‍යාව 36,328ක් (භාරගන්නා ලද නඩු භාණ්ඩ ප්‍රමාණය 124%) වූ අතර එය 2020 වසරට සාපේක්ෂව 26%ක වර්ධනයක් පෙන්නුම් කරයි. මෙයින් පෙනෙන්නේ පසුගිය වසරවල ලැබුණු නඩු සංඛ්‍යාවෙන් වාර්තා නොකර අත ඉතිරි නඩු වාර්තා කිරීමට දෙපාර්තමේන්තුව සමත් වූ හෙයිනි.

2021 (29,355) වර්ෂය තුළ ලැබුණු මුළු නඩු සංඛ්‍යාව 2020 (35,191) වසරට වඩා අඩුය. ඊට අමතරව 2021 (13,358) වසරේ ලැබුණු මත්ද්‍රව්‍ය සහ මනෝවර්තන 2020ට (17,983) වඩා අඩුවිය. මත්ද්‍රව්‍ය නඩු සංඛ්‍යාව ලැබීම අඩුවීම මඟින් පෙන්නුම් කරනුයේ රට තුළට මත්ද්‍රව්‍ය ඇතුළුවීම පාලනය කිරීමට ඵලදායී වී ඇති බව පෙන්නුම් කිරීම සතුටට කරුණකි.

කොවිඩ් ව්‍යාප්තිය හේතුවෙන් රට මුහුණ දී ඇති අභියෝග රැසක් මධ්‍යයේ වුවද නිලධාරීන්ගේ වෙහෙස මහන්සි වී වැය කිරීම සහ කැපවීම සඳහා නිසි ගෞරවය හිමිවිය යුතුයි.

අංශය	විද්‍යාගාරය	**2021.01.01** දිනට නඩු සංඛ්‍යාව	ලැබුණු නඩු සංඛ්‍යාව	වාර්තා කළ නඩු සංඛ්‍යාව	**2021.12.31** දිනට වාර්තා නොකළ නඩු සංඛ්‍යාව
අධිකරණ විද්‍යා ක්ෂේත්‍රය	මත්ද්‍රව්‍ය හා මනෝවර්තක අංශය	5,873	13,358	17,841	1,390
	ගිනිඅවි සහ ප්‍රක්ෂිප්ත විද්‍යා අංශය	436	276	491	221
	පුපුරන ද්‍රව්‍ය හා ගිනි ගැනීම් අංශය	427	515	779	163
	අධිකරණ ධූලක විද්‍යා අංශය (වස වර්ග)	1,994	2,211	2,822	1,383
	අධිකරණ මස්තු විද්‍යා අංශය	3,231	1,385	2,049	2,567
	සැක කටයුතු ලේඛන අංශය - H	143	596	659	80
	ඩිජිටල් අපරාධ අංශය - HD	1,018	543	683	878
	විවිධ අධිකරණ ද්‍රව්‍ය	537	419	591	365
එකතුව		**13,659**	**19,303**	**25,915**	**7,047**
ආහාර විද්‍යා ක්ෂේත්‍රය	මත්පැන් අංශය	741	4,800	5,149	392
	මධ්‍යසාර හා දුම්කොළ අංශය	270	1,691	1,769	192
	ආහාර පනත යටතේ ආහාර සාම්පල අංශය	0	1,768	1,747	21
	විවිධ ආහාර වර්ග	3	1,793	1,748	48
එකතුව		**1,014**	**10,052**	**10,413**	**653**
මුළු එකතුව		**14,673**	**29,355**	**36,328**	**7,700**

වෙනත් කටයුතු

කාර්යය	සංඛ්‍යාව
අධිකරණවලදී සාක්ෂි සැපයූ අවස්ථා	දින 120
අපරාධ ස්ථානවලට සහභාගි වූ අවස්ථා	දින 178
ධූලක විද්‍යා අංශයේ නිලධාරීන් සහභාගි වූ විශේෂ VIP ආහාර පරීක්ෂණ	නිලධාරී දින 22
දේශන පැවැත්වීම	දින 17
තාක්ෂණික ඇගයීම් කමිටු සහභාගිත්වය	දින 00
දේශීය පුහුණු	නිලධාරී දින 20
විදේශීය පුහුණු	නිලධාරී දින 73
පශ්චාත් උපාධිය සඳහා විදේශගත නිලධාරීන් ගණන (එක්සත් රාජධානිය)	04

1. අත ඉතිරි නඩු භාණ්ඩ ප්‍රමාණය අඩු කිරීම

වාර්තා කිරීම සඳහා ඉදිරිපත් කරනු ලබන නඩු පිළිබඳ වාර්තා ප්‍රමාදයකින් තොරව ඉදිරිපත් කිරීම ඉතා වැදගත් වේ. පසුගිය වසරේ විවිධ දුෂ්කරතා මධ්‍යයේ නවක නිලධාරීන් 28 දෙනෙක් සේවයට බඳවා ගැනීම හේතුවෙන් සති කිහිපයක් තුළදී විශාල නඩු භාණ්ඩ සංඛ්‍යාවක් විශ්ලේෂණය අවසන් කිරීමට හැකිවීම සතුටට කරුණකි.

නවක නිලධාරීන් සහ අනෙක් නිලධාරීන් කාර්යාල වේලාවෙන් අමතර පැය කිහිපයක් සේවය කිරීම මඟින් අත ඉතිරි නඩු භාණ්ඩවලින් විශාල ප්‍රමාණයක් අවසන් කිරීමට හැකිවිය. එසේම කාර්යාල වේලාවෙන් අමතර පැය කිහිපයක් සේවය කිරීම මඟින් අත ඉතිරි නඩු භාණ්ඩවලින් විශාල ප්‍රමාණයක් අවසන් කිරීමට හැකිවිය. කාර්යාල වේලාවෙන් අමතර පැය කිහිපයක් සේවය කිරීම මඟින් අත ඉතිරි නඩු භාණ්ඩ වලින් විශාල ප්‍රමාණයක් අවසන් කිරීමට හැකිවිය. අත ඉතිරි නඩු භාණ්ඩ විශ්ලේෂණය සඳහා නවක නිලධාරීන් සහ එදිනෙදා ලැබෙන නඩු භාණ්ඩ විශ්ලේෂණය සඳහා නවක නිලධාරීන් බඳවා ගැනීම සිදු කළ යුතුය.

ඉදිරිපත් වන නඩු භාණ්ඩ පිළිබඳ කටයුතු සිදුවන අතරම කල්ගත වූ නඩු සම්බන්ධ කටයුතු නිම කිරීම සඳහා නිලධාරීන් අතිකාල සේවයේ යෙදවීම අවශ්‍ය වන අතර සතියේ දිනවල අතිරේක පැය කිහිපයක් සේවය කිරීම මෙන්ම රජයේ නිවාඩු දිනවල සේවයේ යෙදවීමටද සිදුවනු ඇත.

මේ සඳහා නිලධාරීන් දිරිමත් වන පරිදි අතිරේක දීමනාවක් අත ඉතිරි වාර්තා නිම කිරීම අවසන් වන තෙක් සිදුකිරීමට සිදුකළ යුතුයි. මෙහිදී විශේෂඥ වාර්තාවල ගුණාත්මකභාවයට හානියක් නොවන පරිදි සුදුසු ක්‍රමවේදයක් තුළින් මෙම කාර්යය ඉටුකිරීම ඉතා වැදගත් වේ.

2020 කාර්යසාධනය



2021 කාර්යසාධනය



2. පර්යේෂණ හා සංවර්ධන අංශයක් ස්ථාපිත කිරීම

නවීනතම විද්‍යාත්මක ක්‍රමවේදයන් පිළිබඳ දැනුම දෙපාර්තමේන්තුවේ කටයුතු සඳහා ඉතා වැදගත් වේ. නව මත්ද්‍රව්‍යයන් හා රසායනිකයන් භාවිතයට එකතුවීම දිනපතා සිදුවන අතර දෙපාර්තමේන්තු නිලධාරීන් මෙම තත්ත්වයන් පිළිබඳ ප්‍රමාණවත් අධ්‍යයනයක් සහිත වීම අවශ්‍ය වේ. මේ සඳහා උනන්දුවක් මෙන්ම දැක්මක් සහිත විද්‍යාත්මක සේවයේ නිරත නිලධාරීන් සඳහා දේශීය වශයෙන් මෙන්ම විදේශීය වශයෙන් අවශ්‍ය උපාධි දක්වා අධ්‍යයන අවස්ථා ලබාදීමද මේ යටතේ සිදුකළ යුතුය.

3. උසාවිවලින් ඉදිරිපත් කරන ලද සාම්පල ඉවත් කිරීම

රටේ ක්‍රියාත්මක වන අධිකරණ ක්‍රමය තුළදී නඩුවක් සඳහා අවසන් තීරණයක් ලැබීම ප්‍රමාද වීම හේතුවෙන් පරීක්ෂණ අවසන් කරන ලද නඩු භාණ්ඩද ඉවත් කර ගැනීම ප්‍රමාද වේ. නඩු භාණ්ඩ ගබඩා කොට ඇති ස්ථානවල ඉඩකඩ වැඩි වැඩියෙන් ඉදිරිපත් වන නඩු භාණ්ඩ ගබඩා කිරීම සඳහා ප්‍රමාණවත් නොවීම දැඩි ගැටලුවකි. මේ හේතුවෙන් වාර්තා ඉදිරිපත් කළ නඩු භාණ්ඩ දෙපාර්තමේන්තු පරිශ්‍රයෙන් කාලානුරූපීව ඉවත් කිරීම සඳහා ක්‍රමවේදයක් සකස් කළ යුතුව ඇත. එබැවින් ගරු අධිකරණ අමාත්‍ය අලි සබ්‍රි සහ ලේකම් මායාදුන්න මහතාගේ

ප්‍රධානත්වයෙන් මත්ද්‍රව්‍ය අන්තරායකර ඖෂධ ඉවත්කිරීමේ කමිටුවක් පිහිටුවා ඇති අතර ආණ්ඩුවේ රස පරීක්ෂකවරයාද මෙම කමිටුවේ එක් සාමාජිකයෙකි. දැන් පොලිස් නිලධාරීන් අධිකරණ නියෝගයක් ඇතිව නඩුභාණ්ඩ ඉවත් කිරීම සිදුකරනු ලබයි.

නඩු භාණ්ඩයේ බර	ඉවත් කිරීමට ඇති නඩු භාණ්ඩ සංඛ්‍යාව	ඉවත් කරන ලද නඩු භාණ්ඩ සංඛ්‍යාව
කි.ග්‍රෑම් 1ට වැඩි	99	42
කි.ග්‍රෑම් 1ට අඩු	91,708	2,840

4. වීඩියෝ තාක්ෂණ ඔස්සේ විශේෂඥ සාක්ෂි ලබාදීම

දිවයින පුරා පිහිටා ඇති උසාවි වල සාක්ෂි දීම සඳහා නිලධාරීන් සහභාගී කරවීමේදී මතුවන ගැටලු අවම කර ගැනීම සඳහා මාර්ගගත වීඩියෝ තාක්ෂණය මගින් කඩිනමින් සාක්ෂි ලබාදීමේ ක්‍රමයක් ඇති කිරීම ඉතාමත් වැදගත් වේ. මූලික පියවරක් ලෙස වීඩියෝ තාක්ෂණ උපකරණ කට්ටල දෙකක් අධිකරණ අමාත්‍ය හා UNDP ව්‍යාපෘතිය මඟින් ලබාදීමට කටයුතු කර ඇත.

5. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය යොදා ගැනීම

දිනෙන් දින වර්ධනය වන නඩු භාණ්ඩ ලැබීම කළමනාකරණය කර ගත හැකි පරිදි තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය යොදා ගැනීම ඵලදායීතාවය වර්ධනය කිරීම කෙරෙහි බලපානු ලබයි.

6. සාම්පල හැසිරවීම සඳහා ස්වයංක්‍රීය ක්‍රමවේදයක් සකසා දීම

ඉදිරිපත් වන සාම්පල හා රසායනාගාර වල තොරතුරු ඵලදැරීම හැසිරවිය හැකි ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම මේ යටතේ අපේක්ෂා කෙරේ.



ගෞරි රමනා
ආණ්ඩුවේ රස පරීක්ෂක

03 පරිච්ඡේදය

සමස්ත මුල්‍යමය කාර්යසාධනය

3.1 මුල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

ඒසීඒ-එෆ්

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුල්‍ය කාර්යසාධන ප්‍රකාශය

අයවැය 2021		සටහන	තත්‍ය 2021 රු.	2020 රු.	
-	**ආදායම් ලැබීම්**		-	-	
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	**2**	-	-	**ඒසීඒ-1**
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	**3**	-	-	
-	බදු නොවන ආදායම් හා වෙනත්	**4**	-	-	
-	**මුළු ආදායම් ලැබීම් (අ)**		-	-	
-	**ආදායම් නොවන ලැබීම්**			-	
-	භාණ්ඩාගාර අග්‍රිම		523,984,000	406,172,667	**ඒසීඒ-3**
-	නැන්පතු		811,251	4,923,847	**ඒසීඒ-4**
-	අත්තිකාරම් ගිණුම්		9,719,796	5,905,103	**ඒසීඒ-5**
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		-	-	
-	**මුළු ආදායම් නොවන ලැබීම් (ආ)**		**534,515,048**	**417,001,617**	
-	**මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)**		**534,515,048**	**417,001,617**	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)		**3,965,500**	**8,676,024**	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඇ)		**530,549,548**	**408,325,593**	
	අඩු කළා : වියදම්				
194,800,000	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	**5**	194,013,399	174,009,761	
224,000,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	**6**	221,733,958	206,323,704	**ඒසීඒ-2(ii)**
2,100,000	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	**7**	1,782,260	2,013,065	
-	පොළී ගෙවීම්	**8**	-	-	
-	වෙනත් පුනරාවර්තන වියදම්	**9**	-	-	
420,900,000	**මුළු පුනරාවර්තන වියදම් (ඊ)**		**417,529,616**	**382,346,529**	

අයවැය 2021		සටහන	තත්‍ය 2021 රු.	2020 රු.	
	මූලධන ව්‍යදම්				
5,300,000	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	**10**	5,036,937	1,422,029	
387,000,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	**11**	107,336,015	22,960,315	
-	ප්‍රාග්ධන මාරුකිරීම්	**12**	-	-	**ඒසිඒ-2(ii)**
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	**13**	-	-	
33,200,000	හැකියා වර්ධනය	**14**	27,598,297	19,243,592	
-	වෙනත් මූලධන ව්‍යදම්	**15**	-	-	
425,500,000	**මුළු මූලධන ව්‍යදම් (උ)**		**139,971,249**	**43,625,936**	
	තැන්පතු ගෙවීම්		539,569	5,281,635	**ඒසිඒ-4**
	අත්තිකාරම් ගෙවීම්		11,029,048	8,436,388	**ඒසිඒ-5**
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-	
	ප්‍රධාන ලෙජර් ව්‍යදම් (ඌ)		**11,568,617**	**13,718,023**	
	මුළු ව්‍යදම් එ = (ඊ+උ+ඌ)		**569,069,483**	439,690,489	
	දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)		**(38,519,935)**	**(31,364,896)**	
	අග්‍රම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය		**(38,519,935)**	**(31,364,896)**	**ඒසිඒ-7**
846,400,000	**දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය**		-	-	**ඒසිඒ-3**
			-	-	

3.2 මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-පී

2021 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන	2021 රු.	2020 රු.
		තත්‍ය	
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසීඒ-6	2,435,137,992	2,319,656,712
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසීඒ-5/5(ඒ)	23,691,214	22,381,962
මූදල් හා මූදල් සමාන දෑ	ඒසීඒ-3	-	-
මුළු වත්කම්		**2,458,829,205**	**2,342,038,674**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		23,310,767	22,273,198
දේපළ පිරියත හා උපකරණ සංචිතය		2,435,137,992	2,319,656,712
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	**ඒසීඒ-5(බී)**	-	-
ජංගම වගකීම්			
තැන්පතු ගිණුම්	ඒසීඒ-4	380,447	108,764
අග්‍රිම ශේෂය	ඒසීඒ-3	-	-
මුළු වගකීම්		**2,458,829,205**	**2,342,038,674**

පිටු අංක 9 සිට 23 දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක 24 සිට 39 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළදිරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

3.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

ඒසීඒ-සී

2021 දෙසැම්බර් **31** දිනට
මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	තක්ෂ	
	2021	**2020**
	රු.	රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මූළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	-	-
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	38,074,016	31,161,274
අග්‍රිම ලැබීම්	523,984,000	406,172,667
අත්තිකාරම් අයකර ගැනීම්	9,766,632	6,607,617
තැන්පතු ලැබීම්	811,251	4,923,847
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**572,635,899**	**448,865,406**
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	420,385,211	381,110,723
සහනාධාර සහ මාරුකිරීම්	1,782,260	2,013,065
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	-	1,143,663
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	3,965,500	8,676,024
අත්තිකාරම් ගෙවීම්	11,029,048	8,436,388
තැන්පතු ගෙවීම්	539,569	5,281,635
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**437,701,587**	**406,661,498**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**134,934,312**	**42,203,907**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
භිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	-	-
උපණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	**-**	**-**
අඩුකළා : මුදල් වැය කිරීම්		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත්	134,934,312	42,203,907
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**134,934,312**	**42,203,907**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය(ඊ) =(ඈ)-(ඉ)	**(134,934,312)**	**(42,203,907)**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල්	**-**	**-**

	තත්‍ය	
	2021	**2020**
	රු.	**රු.**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (උ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(උ)-(එ)	-	-
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)	-	-
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	-	-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	-	-

3.4 මූල්‍ය ප්‍රකාශනවලට සටහන්

වාර්තා කිරීමේ පදනම

1. වාර්තාකරණ කාලපරිච්ඡේදය

2021 ජනවාරි 01 දින සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

2. පිළියෙල කිරීමේ පදනම

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම් වල ඓතිහාසික පිරිවැය නැවත තක්සේරු කරන ලද වටිනාකමට වැඩිදියුණු කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි. මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල් වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

3. ආදායම් හඳුනාගැනීම

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවායේ බදු වන කාලසීමාව නොසලකා, ගිණුම් කාලසීමාව තුළ මුදල් ලැබීම් අනුව හඳුනාගනු ලැබේ.

4. දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇතිවිට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකිනම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ. දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදා ගනී.

5. දේපළ, පිරියත හා උපකරණ සංචිතය

මෙම සංචිත ගිණුම දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම් වේ.

6. මුදල් හා මුදල් සමාන දෑ

2021 දෙසැම්බර් 31 දිනට අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් මුදල් හා මුදල් සමාන දෑ සමන්විත වේ.

3.5 ආදායම් එකතුකිරීමේ කාර්ය සාධනය

ආදායම් ක්ෂේත්‍රය	ආදායම් ක්ෂේත්‍රයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය (රු.)	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස
20.02.01.01	රජයේ ගොඩනැගිලි කුලී	122,000	122,000	190,326	172
20.03.02.99	අනෙකුත් ලැබීම්	10,000,000	10,000,000	26,395,715	264
20.03.99.00	අනෙකුත් ලැබීම්	500,000	500,000	1,294,543	259
20.02.02.99	අනෙකුත් ලැබීම් (පොළිය)	750,000	750,000	896,572	119
20.03.01.00	අනෙකුත් ලැබීම්	-	-	9,216,100	100
20.04.01.00	අනෙකුත් ලැබීම්	-	-	80,760	100

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

වැය විෂයය	ප්‍රතිපාදනය		සත්‍ය වියදම	වියදම සංශෝධිත ඇස්තමේන්තුවේ % ලෙස
	වාර්ෂික අයවැය වෙන්කිරීම	මුළු ශුද්ධ වෙන් කිරීම		
පුනරාවර්තන	420,900,000	420,900,000	417,529,616	99%
මූලධන	425,500,000	425,500,000	139,971,249	33%
එකතුව	846,400,000	846,400,000	557,500,866	

3.7 මු.රෙ 208 අනුව ප්‍රතිපාදන පැවරීම

අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය	අරමුණ	ප්‍රතිපාදනය		සත්‍ය වියදම	වියදම සංශෝධිත ඇස්තමේන්තුවේ % ලෙස
			වාර්ෂික අයවැය	මුළු ශුද්ධ වෙන් කිරීම		
01	ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ යෞවන	උපාධිධාරී දීමනා	60,000.00	60,000.00	0	0

3.8 මූල්‍යමය නොවන වත්කම් වාර්තා කිරීම සම්බන්ධ ප්‍රගතිය

වත්කම් ක්ෂේත්‍රය	ජංගම නොවන වත්කම්	භාණ්ඩ සමීක්ෂණ වාර්තාවේ **2021.12.31** දිනට ශේෂය	මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශයේ **2021.12.31** දිනට ශේෂය	තවමත් ගණුන් ගත යුතු	වාර්තා ගත ප්‍රගතිය % ලෙස
9151	ගොඩනැගිලි සහ ඉදිකිරීම්	1,100,000,000	1,100,000,000	-	100%
9152	2.1 මෝටර් රථ වාහන	18,655,000	18,655,000	-	100%
9152	2.2 යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ	1,233,483	1,233,483,000	-	100%
9153	ඉඩම්	83,000,000	83,000,000	-	100%
9154	මූල්‍ය නොවන වතකම්	-	-	-	-
9155	ජීව විද්‍යාත්මක වත්කම්	-	-	-	-
9160	නොනිම් වැඩ	-	-	-	-
9180	කල්බදු වත්කම්	-	-	-	-

(18)

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. JLO/A/GAD/02/FA/2021/47/C | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 2022 මැයි 30 දින

ආණ්ඩුවේ රස පරීක්ෂක (ගණන්දීමේ නිලධාරී)
ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව

ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naoal.gov.lk

1.2 කන්ත්ඨාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම් මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්,ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා සිදුවීම් වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන මගින් විෂය සමඟ අනුරූප වන බව,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

1.6.1.1 මූල්‍ය නොවන වත්කම්

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයට අනුව දෙපාර්තමේන්තුවේ මූල්‍ය නොවන වත්කම් යටතේ ප්‍රවාහන උපකරණ වල වටිනාකම රු.18,654,796 ක් ලෙස සටහන් කර තිබුණද, දෙපාර්තමේන්තුව විසින් කොම්ට්‍රෝලර් ජනරාල්ට යවාතිබූ වාහන පිළිබඳ විස්තරයට අනුව දෙපාර්තමේන්තුවට අයත් මෝටර් වාහන 24 ක වටිනාකම රු.109,406,795 ක් ලෙස සඳහන් කර තිබුණි. ඒ අනුව මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි මූල්‍ය නොවන වත්කම් වල අගය සහ දෙපාර්තමේන්තුවට අයත් මූල්‍ය නොවන වත්කම්වල අගය අතර රු.90,751,999 ක වෙනසක් නිරීක්ෂණය විය.

2 **මූල්‍ය සමාලෝචනය**

2.1 **වියදම් කළමනාකරණය**

මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව, ඇස්තමේන්තු පිළියෙල කර නොතිබීම නිසා පුනරාවර්තන වැය විෂයයන් 05 ක් සහ එක් මූලධන වැය විෂයයක් වෙත සලසා තිබුණු රු.14,050,000 ක ප්‍රතිපාදන වෙනත් පුනරාවර්තන වැය විෂයයන් 06 ක් සහ එක් මූලධන වැය විෂයයක් වෙත මාරු කර තිබුණි.

2.2 බැඳීම් හා බැරකම්

(අ) මුදල් රෙගුලාසි 94(1) ට පටහැනිව වැය විෂයයන් 04 කට අදාලව සලසා තිබූ ප්‍රතිපාදන මුදල ඉක්මවා රු.2,502,591 ක බැරකම් වලට එළඹ තිබුණි.

(ආ) 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛයේ 10.1 ඡේදය යටතේ මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමට අදාල මාර්ගෝපදේශ 3.4 ප්‍රකාර මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක III යටතේ වන බැඳීම් හා බැරකම් ප්‍රකාශය භාණ්ඩාගාරය විසින් එක් එක් වියදම් ශීර්ෂවලට අදාලව නිකුත් කරනු ලබන බැඳීම් හා බැරකම් ප්‍රකාශය (SA 92) සමඟ සැසඳී තිබිය යුතු වුවත් දෙපාර්තමේන්තු මූල්‍ය ප්‍රකාශන වල සඳහන් බැරකම් සහ භාණ්ඩාගාරයට වාර්තා කල බැරකම්වල එකතුව රු.11,552,941 කින් සැසඳී නොතිබුණි.

2.3 නොසැසඳුණු පාලන ගිණුම

මූල්‍ය ප්‍රකාශනවල ACA 5 ආකෘතියෙන් ඉදිරිපත් කර තිබූ අත්තිකාරම් ගිණුමට අදාල 2021 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාර පොත් අනුව අය විය යුතු හිඟ ණය ශේෂය හා දෙපාර්තමේන්තු පොත් අනුව එම ශේෂය අතර රු.20,660 ක වෙනසක් පැවතුණි.

4

2.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

පහත සඳහන් නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

නීතිරීති රෙගුලාසිවලට යොමුව	අනුකූල නොවීම
(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මූදල් රෙගුලාසි	
(i) මූදල් රෙගුලාසි 104(ග)	සමාලෝචිත වර්ෂය තුළ සිදු වී තිබූ වාහන අනතුරු 03 ක හානි පූර්ණය මුදල රු.53,179 ක් විය. එම අනතුරු සිදු වීමට අදාල හේතු, නිශ්චය වශයෙන් දැන ගැනීමට සහ වගකිව යුතු පාර්ශ්වයන් හඳුනා ගැනීමට මූදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.
(ii) මූදල් රෙගුලාසි 135	නිලධාරියෙකු විශ්‍රාම යාම, ඉවත්වීම, සේවයට නොපැමිණි දින වැනි අවස්ථාවල මූල්‍ය බලතල පැවරෙන ආකාරය යවත්කාලීන කිරීමට යොදා ඇති විධිවිධාන ඇතුලත් කර නොතිබුණි.
(iii) මූදල් රෙගුලාසි 1645 (ඉ)	ඉන්ධන පරීක්ෂාව, මාසික සාරාංශය, මෝටර් රථ අළුත්වැඩියාව, ටයර් සහ බැටරි යෙදීම සහ හදිසි අනතුරු පිළිබඳ විස්තර ඇතුලත් කරමින් වාහන ලොග් සටහන් පොත් පවත්වා නොතිබුණි.
(ආ) 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය	දෙපාර්තමේන්තුව සතු වාහන 16 ක ඉන්ධන දහන පරීක්ෂාව චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව සිදු කර නොතිබුණි.
(ඇ) 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මූදල් චක්‍රලේඛය	රාජ්‍ය මූදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කල මාර්ගෝපදේශ අංක 14 හි සඳහන් ආකෘතිය ප්‍රකාරව වාර්ෂික කාර්යසාධන වාර්තාවේ කෙටුම්පතක් මූල්‍ය ප්‍රකාශන සමග විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

2.5 නත්කාර්යය පසුබැ දැමීම

2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මූදල් චක්‍රලේඛයේ 9 ඡේදය ප්‍රකාරව විශේෂ කාර්යයක් සඳහා මාණ්ඩලික නත්තිවයේ නිලධාරීන්ට ලබාදෙන අතුරු අග්‍රිම අදාල කාර්යය නිමකල විගසම පියවිය යුතු නමුත් අවස්ථා 05 කදී ලබා දී තිබූ අත්තිකාරම් පියවීමට දින 15 සිට දින 82 ක කාලයක් ගත කර තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමනාකරණ දුර්වලතා

ආරක්ෂක පද්ධතිවල ක්‍රියාකාරීත්වය හා සේවා ගිවිසුම් යාවත්කාලීන නොකිරීම.

දෙපාර්තමේන්තුවේ ආරක්ෂක කැමරා පද්ධතිය (CCTV) වසරකට වැඩි කාලයක සිට සේවා හා නඩත්තු කටයුතු සිදු නොකර තිබීමෙන් 2022 පෙබරවාරි 23 දින වන විට එය නිසි පරිදි ක්‍රියාත්මක නොවීය. L.P. ගෑස් කාන්දු නිරාවරණ සංඥා පද්ධතියේ සේවා හා නඩත්තු සඳහා ගිවිසුම් ගතව සිටි ආයතනයේ අසතුටුදායක සේවා තත්ත්වය නිසා වසර දෙකක පමණ කාලයකට පෙර සිට එම ගිවිසුම අනුව සේවා සිදු කර නොතිබුණි. එමෙන්ම දෙපාර්තමේන්තුවේ විද්‍යාගාර වල ගෑස් කාන්දු සිදු වන බවත් එම තත්ත්වය හඳුනාගැනීමේ උපකරණ ද අක්‍රීයව පැවතුණි. රසායන ද්‍රව්‍ය ගබඩාව, සාමාන්‍ය ගබඩාව, විදුලි කාමරය සහ පොම්පාගාරයේ වාතාශ්‍ර සලසන පද්ධතියට අදාල සේවා සහ නඩත්තු ගිවිසුම සහ CT විද්‍යාගාරයේ තිබෙන වායු සමීකරණ යන්ත්‍රවලට අදාල සේවා හා නඩත්තු ගිවිසුම 2021 වර්ෂයේ අගෝස්තු මාසයේ දී අවසන් වී තිබුණ ද 2022 පෙබරවාරි 23 වන විගණන දින වන විටත් සේවා හා නඩත්තු ගිවිසුම් අත්සන් කර සේවා කටයුතු සිදු කර නොතිබුණි. මේ නිසා ශ්‍රී ලංකාවේ ඇති එකම අධිකරණ විද්‍යා විද්‍යාගාරය, එහි ඇති නඩු භාණ්ඩ, විද්‍යාගාර වාර්තා සහ තහවුරු කල නඩු වලට අදාල විද්‍යාගාර වාර්තා අනාරක්ෂිත තත්ත්වයකට පත්ව තිබුණි.

3.2 අපේක්ෂිත නිමැවුම් මට්ටම් ලබා නොගැනීම

දෙපාර්තමේන්තුවේ විවිධ අංශයන්ගෙන් නඩු කටයුතු සඳහා විශේෂඥ වාර්තා ලබා ගැනීමේ අරමුණින් කැඳවා තිබූ වාර්තා වලින් 14,673 ක් 2020 දෙසැම්බර් 31 දිනට ලබා දීමට නොහැකිව තිබූ අතර සමාලෝචිත වර්ෂය තුල දී වාර්තා 29,273 ක් අධිකරණයට කැඳවා තිබුණි. කෙසේ වෙතත් සමාලෝචිත වර්ෂය තුල දී අධිකරණය වෙත වාර්තා 36,328 ක් ලබා දී තිබුණු අතර වාර්තා 7,618 ක් ලබා දීමට නොහැකි වී තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ කැඳවා තිබූ වාර්තා වලින් ලබා දීමට නොහැකි වූ වාර්තා ප්‍රමාණය සියයට 17 ක් විය.

3.3 ප්‍රසම්පාදනයන්

රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 2006 හි 4 (2)(2) ප්‍රකාරව සකස් කල යුතු ප්‍රසම්පාදන කටයුතු ආරම්භ වීමේ අවස්ථාවේ සිට අවසන් කරන තුරු එක් එක් ප්‍රසම්පාදන ක්‍රියාවන් හි විස්තර දැක්වෙන පරිදි විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි.

3.4 රජයේ නිලධාරීන්ගේ ඇප තැබීම

2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයට අනුව මුදල් රෙගුලාසි 315 (1) ප්‍රකාරව සහ මුදල් රෙගුලාසි 880 ප්‍රකාරව රජයේ නිලධාරීන්ගේ ඇප ආඥා පනතට අනුකූලව ඇප තැබිය යුතු නිලධාරීන්ගෙන් ඇප ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. තවද ඇප ලේඛණයක් ද පවත්වාගෙන ගොස් නොතිබුණි.

4. යහපාලනය

4.1 අභ්‍යන්තර විගණනය

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 (1) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ 2021 වර්ෂය වෙනුවෙන් අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි.

(ආ) 2021 වර්ෂය සඳහා අභ්‍යන්තර විගණන සැලැස්මක් සකස් කර ක්‍රියාත්මක කර නොතිබුණි.

5. මානව සම්පත් කළමනාකරණය

(අ) දෙපාර්තමේන්තුවේ කාර්යභාරය ඉටු කිරීම සඳහා අනුමත කාර්ය මණ්ඩලයේ 2021 දෙසැම්බර් 31 දිනට ජ්‍යෙෂ්ඨ හා තෘතීයික මට්ටමේ පුරප්පාඩු 32 ක් වූ අතර එය අනුමත සේවක සංඛ්‍යාවෙන් සියයට 24 ක ප්‍රතිශතයක් විය. එකී පුරප්පාඩු පිරවීමට කටයුතු කර නොතිබීම දෙපාර්තමේන්තුවේ කාර්ය සාධනයට සෘජුවම බලපා තිබුණි.

(ආ) රාජ්‍ය අංශය තුළ මානව සම්පත් සංවර්ධනය කිරීම මැයෙන් වූ 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ ඇමුණුම් 01, 02 හා චක්‍රලේඛයේ 6.1 හා 6.5 ඡේද ප්‍රකාරව ඉටු කළයුතු අවශ්‍යතාවයන්, සමාලෝචිත වර්ෂයේ දෙපාර්තමේන්තුව තුළ ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඇ) විදේශ රැකියා සඳහා වැටුප් රහිත නිවාඩු ලබා දීම

ශ්‍රී ලංකාවේ අධිකරණ වල පැවැත්වෙන නඩු කටයුතු සඳහා දෛනිකව ලබා දිය යුතු විද්‍යාගාර වාර්තා ලබා දීමට නොහැකිව, ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධාරීන්ගේ කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු සියයට 36 ක් 2019 දෙසැම්බර් 31 දිනට තිබිය දී සහ විද්‍යාත්මක සේවයේ නිලධාරීන් මෙන්ම සියළුම නිලධාරීන් සාමාන්‍ය රාජකාරී කාලයට අතිරේක කාලයක් සඳහා විශේෂ දීමනා ගෙවමින් සේවයේ යොදවන වතාවරණයන් තුල නිලධාරීන් රාජකාරී ආවරණය කිරීම සඳහා වැඩ පිළිවෙලක් යොදා ඇති බව සහතික කරමින් නිලධාරීන් දෙදෙනකු (02) සඳහා වැටුප් රහිත වසර 03 ක සහ වසර 05 ක් විදේශ රැකියා

සඳහා නිවාඩු නිර්දේශ කර තිබුණි. එම නිලධාරීන් විගණන දිනය වූ 2022 මාර්තු 23 වන විටත් ආපසු සේවයට වාර්තා කර නොතිබූ අතර රජයට අයවිය යුතු රු.1,724,506 ක මුදල අයකර ගැනීමට ගිවිසුම් ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(අ) **විදේශීය පණිවුඩ් උපාධි පාඨමාලා සඳහා වැටුප් සහිත විදේශ නිවාඩු ලබා ගෙන ආපසු නොපැමිණීම**

දෙපාර්තමේන්තුවේ එක් නිලධාරිනියක් පශ්චාත් උපාධි පාඨමාලාවක් සඳහා විදේශ නිවාඩු ලබා ගෙන විගණිත දිනය වූ 2022 මාර්තු 23 වන විටත් ආපසු නොපැමිණීම නිසා, රජයෙන් ගෙවා තිබූ මුදල් සහ නිලධාරිනියට ගෙවූ වැටුප්වල එකතුව රු.9,270,726 ක් සහ ලැප්ටොප් පරිගණකයක් ඇතුළු රජයේ දේපල වලින් රජයට අලාභයක් කර තිබිය දී ආයතන සංග්‍රහයේ XV පරිච්ඡේදයේ 4.12 වගන්තිය ප්‍රකාරව අත්සන් කර තිබූ ඇප බැඳුම්කරය අනුව අදාල ඇපකරුවන්ගෙන් හෝ එම මුදල් අයකර ගැනීමට වසරක කාලයක් ගත වී තිබුණ ද ඒ සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි.

එම්. සෝමතිලක
නියෝජ්‍ය විගණකාධිපති
ආර්ථික විගණන කාර්යාලය

එම්.සෝමතිලක
නියෝජ්‍ය විගණකාධිපති

විගණකාධිපති වෙනුවට

04 පරිච්ඡේදය

කාර්යසාධන දර්ශක

ක්‍රියාකාරී සැලැස්මට අනුව දෙපාර්තමේන්තු කාර්යසාධන දර්ශක

දර්ශකය	සත්‍ය නිමවුම අපේක්ෂිත නිමවුමේ ප්‍රතිශතයක් ලෙස		
	90%-100%	75%-89%	50%-74%
● විශ්ලේෂණය සඳහා ඉදිරිපත් ආහාර විද්‍යා අංශයට අදාළ නඩු භාණ්ඩ සංඛ්‍යාවට සමාන හෝ ඊට වැඩි වාර්තා ප්‍රමාණයක් නිකුත් කිරීම.	103%		
● විශ්ලේෂණය සඳහා ඉදිරිපත් අධිකරණ විද්‍යා අංශයට අදාළ නඩු භාණ්ඩ සංඛ්‍යාවට සමාන හෝ ඊට වැඩි වාර්තා ප්‍රමාණයක් නිකුත් කිරීම.	134%		
● අපරාධ ස්ථාන පරීක්ෂාවට අදාළ කාලයක් තුළ නිකුත් කිරීම.		80%	

05 පරිච්ඡේදය

සුහුරු සංවර්ධන ඉලක්ක

තිරසාර සංවර්ධන ඉලක්ක ළඟාකර ගැනීම පිළිබඳ ප්‍රගතිය

අරමුණ	ඉලක්කය	ළඟා කර ගැනීමේ දර්ශක	නිවැරදි දිනට ළඟාකර ගැනීමේ ප්‍රගතිය		
			0%-49%	50%-74%	75%-100%
සාමය, යුක්තිය හා ශක්තිමත් ආයතන 2030 වර්ෂය වන විට නීතිය හා නීතිය ක්‍රියාත්මක කරන ආයතන සඳහා නඩු භාණ්ඩ විශ්ලේෂණයෙන් අනතුරුව නිකුත් කරන විද්‍යාත්මක වාර්තා මාස 03ක කාලයක් තුල ලබාදීමට කටයුතු කිරීම.	තිරසාර සංවර්ධනය සඳහා සාමකාමී සහ සියලු දෙනා ඇතුලත් වූ සමාජයක් ප්‍රවර්ධනය කිරීම, සියලු දෙනාටම යුක්තිය සඳහා ප්‍රවේශයක් සැලසීම සහ ඵලදායී, වගකීමක් සහිත හා පූර්ණ ආයතන සියලු මට්ටම් සඳහා ඇති කිරීම.	● විශ්ලේෂණය සඳහා ඉදිරිපත් ආහාර විද්‍යා අංශයට අදාළ නඩු භාණ්ඩ සංඛ්‍යාවට සමාන හෝ ඊට වැඩි වාර් තා ප්‍රමාණයක් මාස තුනක කාලයක් තුළ නිකුත් කිරීම.			100%
		● විශ්ලේෂණය සඳහා ඉදිරිපත් අධිකරණ විද්‍යා අංශයට අදාළ නඩු භාණ්ඩ සංඛ්‍යාවට සමාන හෝ ඊට වැඩි වාර්තා ප්‍රමාණයක් නිකුත් කිරීම.			95%
		● අපරාධ ස්ථාන පරීක්ෂාවට අදාළ මාස 3ක කාලයක් තුළ නිකුත් කිරීම.		70%	

06 පරිච්ඡේදය

මානව සම්පත් කළමනාකරණය හා පරිපාලනය

6.1 කාර්ය මණ්ඩල කළමනාකරණය

සේවක කාණ්ඩ මට්ටම	අනුමත සංඛ්‍යාව	දැනට සිටින සංඛ්‍යාව
ජ්‍යෙෂ්ඨ මට්ටම	125	102
තෘතීය මට්ටම	10	1
ද්විතීය මට්ටම	116	94
ප්‍රාථමික මට්ටම	84	64
එකතුව	**335**	**261**

6.2 කාර්ය මණ්ඩල ඌණතා හා අතිරික්ත

	තනතුර	සේවය	ශ්‍රේණිය	වැටුප් ක්ෂේත්‍රය	අනුමත සේවක සංඛ්‍යාව			දැනට සිටින සේවක සංඛ්‍යාව				හිඟ/අතිරික්ත
					ස්ථිර	කොන්ත්‍රාත්	අනියම්	ස්ථිර	කොන්ත්‍රාත්	අනියම්	වෙනත් (වැඩ බලන)	
1	ආණ්ඩුවේ රස පරීක්ෂක	SLSS	Sp.	SL 3	1			0			1	1
2	ආණ්ඩුවේ අතිරේක රස පරීක්ෂක (විශේෂ පන්තිය)	SLSS	Sp.	SL 3	2			0			2	2
3	සැක කටයුතු ලේඛන පිළිබඳ ආණ්ඩුවේ පරීක්ෂක	SLSS	Sp.	SL 1	1			0			1	1
4	ආණ්ඩුවේ නියෝජ්‍ය රස පරීක්ෂක	SLSS	I	SL 1	8			7			0	1
5	සැක කටයුතු ලේඛන පිළිබඳ ආණ්ඩුවේ නියෝජ්‍ය පරීක්ෂක	SLSS	I	SL 1	2			1			1	1
6	අධ්‍යක්ෂ (පරිපාලන) ශ්‍රී.ල.ප.සේ.1 පන්තිය	SLAS	I	SL 1	1			0			1	1
7	ප්‍රධාන ගණකාධිකාරී ශ්‍රී.ල.ග.සේ.1 පන්තිය	SLAcS	I	SL 1	1			1				0
8	අභ්‍යන්තර විගණක	SLAcS	II/III	SL 1	1			0			1	1
9	ජ්‍යෙෂ්ඨ සහකාර රස පරීක්ෂක/සහකාර රස පරීක්ෂක	SLSS	II/III	SL 1	93			80				13
10	සැක කටයුතු ලේඛන පිළිබඳ ආණ්ඩුවේ ජ්‍යෙෂ්ඨ පරීක්ෂක/සහකාර පරීක්ෂක	SLSS	II/III	SL 1	14			12				2
11	ගණකාධිකාරී ශ්‍රී.ල.ග.සේ. 111 පන්තිය	SLAcS	II/III	SL 1	1			1				0
	ජ්‍යෙෂ්ඨ මට්ටම එකතුව				125	0	0	102	0	0	7	23
12	රසායනාගාර සහකාර සේවය (අධි පන්තිය)	SLTS Supra	Sp.	MN -7	5			0				5
13	පරිපාලන නිලධාරී	PMAS Supra	Sp.	MN -7	1			1				0
14	භාෂා පරිවර්තක සේවය	TS	III	MN -6	2			0				2
15	ශ්‍රී. ල. තො. හා ස.ස.තා. සේවය 2 පන්තියේ 11/1 ශ්‍රේණිය		II	MN -6	2			0			1	2
	තෘතීය මට්ටම එකතුව				10	0	0	1	0	0	1	9

	තනතුර	සේවය	ශ්‍රේණිය	වැටුප් ක්ෂේත්‍රය	අනුමත සේවක සංඛ්‍යාව			දැනට සිටින සේවක සංඛ්‍යාව				පුරප්පාඩු
					ස්ථිර	කොන්ත්‍රාත්	අනියම්	ස්ථිර	කොන්ත්‍රාත්	අනියම්	වෙනත් (වැඩ බලන)	
16	පරීක්ෂණ නිලධාරී	Dept	I/II/III	MN -4	1			1				0
17	සංවර්ධන නිලධාරී	POS	I/II/III	MN -4	6			3				3
18	පුස්තකාලයාධිපති	SLGLS	I/II/III	MN -3	1			0				1
19	රසායනාගාර සහකාර සේවය	Dept	I/II/III	MN -3	50			44				6
20	තාක්ෂණ නිලධාරී	Dept	I/II/III	MN -3	1			0				1
21	කළමනාකරණ සේවා නිලධාරී	PMAS	I/II/III	MN -2	36			29				7
22	යතුරු ලේඛක	Dept	I/II/III	MN -2	10			10				0
23	ශ්‍රී.ල.තො.හා.ස.තා.සහකාර	Dept	I/II/III	MT-1	10			6				4
24	පරිගණක ක්‍රියාකරු	Dept		MN-1	1			1				0
	ද්විතීය මට්ටම එකතුව				116	0	0	94	0	0	0	22
25	රියදුරු සේවය	DS	Sp/I/II/ III	PL-3	21			18				3
26	රසායනාගාර සහායක	Dept	I/II/III	PL-2	12			3				9
27	ගොඩනැගිලි නඩත්තු සහායක	Dept	I/II/III	PL-2	2			0			1	2
28	පුස්තකාල සහායක	Dept	I/II/III	PL-2	1			1				0
29	කාර්යාල සේවක සේවය	OES	Sp/I/II/ III	PL-1	38			33				5
30	විද්‍යාගාර ඕඩර්ලි	Dept	I/II/III	PL-1	10			9				1
	ප්‍රාථමික මට්ටම එකතුව				84	0	0	64	0	0	0	20
	මුළු එකතුව				**335**	**0**	**0**	**261**	**1**	**0**	**6**	**74**

පහත වගුව මඟින් මානව සම්පත් හිඟය ඵලදායීතාවය කෙරෙහි බලපා ඇති ආකාරය මනාව සටහන් වේ. 2018 වර්ෂයේ නවක නිලධාරීන් 28 දෙනෙක් බඳවා මඟින් හා කාර්යාල වේලාවට අමතර පැය කිහිපයක් වැඩ කිරීම මඟින් ඵලදායීත්වය වර්ධනය වී ඇත. සේවක සංඛ්‍යාව වැඩි කිරීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉල්ලීමක් කර ඇත.



6.3 මානව සම්පත් සංවර්ධනය

01	**බඳවා ගන්නා ලද නිලධාරීන්**	**2020**	**2021**
i	සහකාර රස පරීක්ෂක	**27**	**03**
ii	යතුරු ලේඛක	**10**	**01**
iii	රසායනාගාර සහකාර	**02**	**04**
02	**උසස් වීම් ලද නිලධාරීන්**	**2020**	**2021**
i	නියෝජ්‍ය රස පරීක්ෂක ලෙස උසස් වීම් ලද නිලධාරීන්	**07** i. පී. ජී. මඩවල මයා ii. ඩී. සෙනෙවිරත්න මිය iii. එම්. ජී. එස්. ඒ විමලසේන මිය iv. කේ.පී. චන්ද්‍රානි මිය v. ජේ.එම්.ආර්. ජයසුන්දර මයා vi. ඩබ්.ඩී.වී. කරුණාරත්න මිය vii. කේ.ඒ.පී. බන්දුමාලා මිය	-
ii	**III** ශ්‍රේණියේ සිට **II** ශ්‍රේණියට උසස් වීම් ලද නිලධාරීන්	-	**26**
03	**විශ්‍රාම ගිය නිලධාරීන්**	**2020**	**2021**
i	ආණ්ඩුවේ රස පරීක්ෂක	**01**	**-**
ii	අතිරේක රස පරීක්ෂක	**-**	**01**
iii	සැකකටයුතු ලේඛන පිළිබඳ ආණ්ඩුවේ පරීක්ෂක	**-**	**01**
04	**සේවය හැර ගිය නිලධාරීන්**	**2020**	**2021**
i	සහකාර රස පරීක්ෂක	**01**	**-**
Ii	සැකකටයුතු ලේඛන පිළිබඳ ආණ්ඩුවේ සහකාර පරීක්ෂක	**-**	**01**
Iii	රසායනාගාර සහායක	**01**	**02**
Iv	යතුරු ලේඛක	**-**	**01**
05	**සේවය අත්හිටුවන ලද නිලධාරීන්**	**2020**	**2021**
i	සහකාර රස පරීක්ෂක	01	-

6.3.1 පශ්චාත් උපාධි උපාධිය

දේශීය

	නිලධාරියාගේ නම	**තනතුර**	**පශ්චාත් උපාධි උපාධිය**	**ආයතනය**
01	ඩබ්. ජී. ඩී. එල් ගුණතිලක	සැක කටයුතු ලේඛන පිළිබඳ	Information Security	කොළඹ විශ්වවිද්‍යාලය

විදේශීය

	නම	**රට**	**කාල සීමාව**	**පශ්චාත් උපාධි උපාධිය**
01	ඩබ්. ඒ. එච්. සංජය මයා	එක්සත් රාජධානිය	2021.09.17-2022.09.16	M.Sc. in Forensic Science
02	ඩී.එම්.ජී.සී. බණ්ඩාර මයා	එක්සත් රාජධානිය	2020.09.14-2021.09.14	M.Sc. in Forensic Science
03	ටී.එච්. කුරුකුලනාථ මිය	එක්සත් රාජධානිය	2020.09.14-2021.09.14	M.Sc. in Pharmaceutical Analysis
04	එල්.ඒ.ඩබ්.කේ. දහනායක මිය	එක්සත් රාජධානිය	2020.10.01-2021.10.15	M.Sc. in Forensic Science

6.3.2 පුහුණු හා සම්මන්ත්‍රණ (මාර්ගගතව)

දේශීය

	නිලධාරියාගේ නම	පුහුණුව	ආයතනය	කාලසීමාව
01	එම්.ඒ. කේ. කේ. පී. පෙරේරා මිය	Workshop on Internal Auditing for ISO 14001: 2015 EMS	Sri Lanka Standards Institution	2021.02.10-2021.02.11
02 03 04 05	එන්. අයි. කේ. ප්‍රනාන්දු මිය පී. ජී. ද සිල්වා මිය ඩී. ආර්. අයි. උදේශිනී මිය එච්. එන්. ඒ. පෙරේරා මිය	Workshop on Analytical Method Validation and Verification (SLATL)	Association of Testing Laboratories	2021.03.26
06 07	එම්. ඒ. කේ. කේ. පී. පෙරේරා මිය ටී. ආර්. එම්. සී. ඩී. මැණිකේ මිය	Awareness Programme on ISO 14001 : 2015 Environmental Management Systems Standards Requirements	Sri Lanka Standards Institution	2021.03.31
08 09 10	දීපිකා සෙනෙවිරත්න මිය කේ. කේ. අප්සරා මිය ඩබ්. ඩී.වී. කරුණාරත්න මිය	Project Proposal Writing Skills	Miloda Institute	2021.05.05-2021.05.06
12 13 14	ඩබ්. ඒ. ආර්. ප්‍රනාන්දු මයා කේ. වී. රත්නපාල මිය කේ. ඒ. ඩී. සී. කොඩිතුවක්කු මිය	මූලික විමර්ශන පුහුණුව	Skills Development Fund Development	2021.11.09-2021.11.10
15 16 17 18	ඩබ්. ඩී. වී. කරුණාරත්න මිය කේ. ඒ. එස්. අයි. කේ. කළුආරච්චි මයා එල්. එස්. හතුරුසිංහ මිය ඩබ්. පී. අයි. උදයංගනී මිය	Bid Evaluation Programme	Skills Development Fund Development	2021.11.25-2021.11.26
19	ජේ.ඒ.පී.කේ.ටී. කුමාර මයා	Public Sector Inventory	DLC	2021.12.22-2021.12.23

විදේශීය

වැඩසටහනේ නම	සහභාගී වූ නිලධාරීන් ගණන	වැඩසටහනේ කාලය	රට
● Law Enforcement Assistance for Digital Evidence	1	1	Interpol
● Improvised explosive device threat awareness for	4	5 days	US Embassy
● Drug Chemistry (Narcotics Drugs and Psychotropic)	25	3 Months	National Forensic Science and Technology center at Florida International University US
● Firearms Examiner	7	9 Months	National Forensic Science and Technology center at Florida International University US
● DNA Analyst training and assessment program	12	12 Months	National Forensic Science and Technology center at Florida International University US
● Capacity improvement and advancement for	12	1 week	National Forensic Science, Korea KOICA
● Capacity improvement and advancement for	8	1 week	National Forensic Science, Korea KOICA

07 පරිච්ඡේදය

අනුකූලතා වාර්තාව

අංකය	අදාල අවශ්‍යතාවය	අනුකූලතා තත්වය	අනුකූල නොවීම සඳහා පැහැදිලි කිරීම	නිවැරදි කිරීමේ ක්‍රියා
1	නියමිත දිනයට මූල්‍ය ප්‍රකාශන/ගිණුම් ඉදිරිපත් කර තිබුණේ?			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශන	ඔව්		
1.2	රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම	ඔව්		
1.3	වෙළඳ සහ නිෂ්පාදන අත්තිකාරම් ගිණුම (වාණිජ අත්තිකාරම් ගිණුම)	අදාල නැත		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම	අදාල නැත		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම	අදාල නැත		
1.6	වෙනත් - පොදු තැන්පත් ගිණුම	ඔව්		
2	පොත් පත් හා ලේඛන නඩත්තු කිරීම			
2.1	2018.11.21 දිනැති අංක 267/2018 දරන රාජ්‍ය ගිණුම් චක්‍ර ලේඛය ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛනය	ඔව්		
2.2	පුද්ගල පඩි නඩි ලේඛනය/පුද්ගල පඩි නඩි කාඩ්පත්	ඔව්		
2.3	විගණන විමසුම් ලේඛනය	ඔව්		
2.4	අභ්‍යන්තර විගණන විමසුම් ලේඛනය	අදාල නැත		
2.5	සිගාස් පරිගණක වැඩසටහන ක්‍රියාත්මක කර මාසික ගිණුම් සාරාංශ පිළියෙල කර භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කරන්නේද?	ඔව්		
2.6	ලැබෙන චෙක්පත්, මුදල් ඇණවුම් ආදිය සඳහා වූ ලේඛනය	ඔව්		
2.7	බඩු ලේඛන පොත	ඔව්		
2.8	තොග පොත	ඔව්		
2.9	හානි පිළිබඳ ලේඛනය	ඔව්		
2.10	බැරකම් ලේඛනය	ඔව්		
2.11	චෙක්පත් උප පත්‍රිකා ලේඛනය	ඔව්		
3	මූල්‍ය බලතල පැවරීම			
3.1	මුදල් රෙගුලාසි 135 ප්‍රකාරව ආයතනය තුළ මූල්‍ය බලතල පැවරීමක් සිදුකර තිබේද?	ඔව්		
3.2	මූල්‍ය බලතල පැවරීම ආයතනය තුළ සන්නිවේදනය කර තිබේද?	ඔව්		
3.3	එම මූල්‍ය බලතල පැවරීමේදී සෑම ගණුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි දෙනෙකුගේ පරීක්ෂාවට ලක්වන පරිදි බලතල පවරා තිබුණේද?	ඔව්		
3.4	2004.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව රජයේ වැටුප් සකස් කිරීමේ පරිගණක මෘදුකාංගය භාවිතා කිරීමේදී ගණකාධිකාරීවරුන් විසින් පහත සඳහන් පාලන ක්‍රම අනුගමනය කර තිබේද?	ඔව්		

අංකය	අදාල අවශ්‍යතාවය	අනුකූලතා තත්වය	අනුකූල නොවීම සඳහා පැහැදිලි කිරීම	නිවැරදි කිරීමේ ක්‍රියා
4	වාර්ෂික සැලසුම් පිළියෙල කිරීම			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිලියෙළ කර තිබුණේද?	ඔව්		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර තිබුණේද?	ඔව්		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කර තිබේද?	අදාල නැත		
4.4	ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීම සඳහා වාර්ෂික ඇස්තමේන්තුව සකස් කර තිබේද?	ඔව්		
4.5	වර්ෂය ආරම්භයේදී එක් එක් මාසයට අදාළව අවශ්‍ය වන මුදල් අවශ්‍යතාවය ඇතුළත් මුදල් ප්‍රවාහය සැලසුම් කර එය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කළේද?	ඔව්		
5	විගණන විමසුම්			
5.1	විගණකාධිපති විසින් ඉදිරිපත් කර ඇති සියළුම විගණන විමසුම් සඳහා මාසයක් ඇතුළදී පිළිතුරු ඉදිරිපත් කර තිබේද?/විගණන විමසුම් නොතිබුණේද?	අදාල නැත		
6	අභ්‍යන්තර විගණනය			
6.1	සියළුම අභ්‍යන්තර විගණන විමසුම් සඳහා මාසයක් ඇතුළතදී පිළිතුරු ඉදිරිපත් කර තිබුණේද? අභ්‍යන්තර විගණන විමසුම් නොතිබුණේද?	අදාල නැත		
6.2	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව 2018.08.01 දිනෙන් පසුව සියළුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන්නේද? එවැනි වාර්තා නොතිබුණේද?	අදාල නැත		
6.3	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කරනු ලබන්නේද? එවැනි වාර්තා නොතිබුණේද?	අදාල නැත		
6.4	මුදල් රෙගුලාසි 134(2) ප්‍රකාරව විගණකාධිපති විමසා අභ්‍යන්තර විගණන වැඩසටහන වර්ෂය ආරම්භයේදී පිළියෙල කරන ලද්දේද?	අදාල නැත		
7	විගණන හා කළමනාකරණ කමිටුව			
7.1	විගණන හා කළමනාකරණ කමිටුවේ රැස්වීම් අවම වශයෙන් වර්ෂයකට 04ක් හෝ පවත්වා තිබුණේද? සහභාගී වී තිබුණේද?	අදාල නැත		
8	වත්කම් කළමනාකරණය			
8.1	2017.07.26 දිනැති අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 7 ඡේදය ප්‍රකාරව 2018 වර්ෂයේදී මිලදී ගන්නා ලද වත්කම් හා අපහරණයන් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාල වෙත ඉදිරිපත් කරන ලද්දේද?	ඔව්		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 ඡේදය ප්‍රකාරව චක්‍ර ලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු නිලධාරියෙකු පත් කර ඒ බව කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලයට දන්වා යවන ලද්දේද?	ඔව්		

අංකය	අදාල අවශ්‍යතාවය	අනුකූලතා තත්වය	අනුකූල නොවීම සඳහා පැහැදිලි කිරීම	නිවැරදි කිරීමේ ක්‍රියා
8.3	2016.03.31 දිනැති අංක 05/2016 දරණ රාජ්‍ය මුදල් චක්‍ර ලේඛය ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණය කර නියමිත දිනට අදාළ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කළේද?	ඔව්		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍ර ලේඛයේ සඳහන් කාල වකවානු තුළ සිදුකර තිබුණේද? එවැනි දෝෂ සිදුකර තිබුණේද? එවැනි දෝෂ සිදුවී නොතිබුණේද?	ඔව්		
8.5	මු.රෙ 772 අනුව අබලි ද්‍රව්‍ය අපහරණය කර තිබේද?	ඔව්		
9	වාහන පාලනය			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා පිළියෙල කර විගණකාධිපති වෙත ඉදිරිපත් කරනු ලබන්නේද?	ඔව්		
9.2	වාහනයක් ගර්හිත වී මාස 6කට වඩා අඩු කාලයකදී අපහරණය කරනු ලබන්නේද? එවැනි වාහන නොතිබුණේද?	ඔව්		
9.3	සෑම වාහනයක් සඳහාම වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර තිබේද?	ඔව්		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ 103,104,109 හා 110 ප්‍රකාරව කටයුතු කර තිබේද? එසේ අනතුරු සිදුවී නොතිබුණේද?	ඔව්		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව සතු වාහන වල ඉන්ධන දහනය වීම පිළිබඳ පරීක්ෂාවන් කර තිබේද?	ඔව්		
9.6	ලීසිං වාරික ගෙවා අවසන් වාහන වල පරම අයිතිය පවරාගෙන තිබුණේද?	ඔව්		
10	බැංකු ගිණුම් ප්‍රකාශය			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා සූදානම් කර තිබුණේද?	ඔව්		
10.2	සමාලෝචන වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂ වල සිට පැවත එමින් තිබුණු අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කළේද? එවැනි ගිණුම් නොතිබුණේද?	ඔව්		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ ගැලපුම් කළ යුතුව තිබුණු ශේෂ සම්බන්ධයෙන් මු.රෙ ප්‍රකාරව කටයුතු කර එම ශේෂ මාසයක් ඇතුලත නිරවුල් කර තිබුණේද?/එවැනි ගැලපුම් නොතිබුණේද?	ඔව්		
11	ප්‍රතිපාදන උපයෝජනය			
11.1	වැය විෂයකට හෝ ව්‍යාපෘතියකට හෝ වැඩසටහනකට හෝ ශීර්ෂයකට සලසා තිබුණු ප්‍රතිපාදන සීමාව නොඉක්මවා වියදම් කර තිබුණේද?	ඔව්		
11.2	මු.රෙ 94(1) ප්‍රකාරව වැය විෂයයකට සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂය අවසානයට ඉතිරි වූ ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම් වලට එළඹ තිබුණේද? එවැනි බැරකම් වලට එළඹ නොතිබුණේද?	ඔව්		

අංකය	අදාල අවශ්‍යතාවය	අනුකූලතා තත්වය	අනුකූල නොවීම සඳහා පැහැදිලි කිරීම	නිවැරදි කිරීමේ ක්‍රියා
12	රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම			
12.1	අදාළ අත්තිකාරම් කාර්යය සඳහා පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් පිළිපැද තිබුණේද? / පාර්ලිමේන්තුව විසින් අත්තිකාරම් කාර්යයක් පවරා තිබුණේද?	ඔව්		
12.2	හිඟිහිටි ණය ශේෂ වල කාල විශ්ලේෂණයක් පිළියෙළ කර තිබුණේද? එවැනි ශේෂ නොතිබුණේද?	ඔව්		
12.3	වර්ෂ 1කට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබුණේද? එවැනි හිඟහිටි ශේෂ නොතිබුණේද?	නැත	රු.18,754/- ක ණය ශේෂය නඩු තීන්දුවෙන් පසුව නිරවුල් කරනු ඇත.	
13	පොදු තැන්පත් ගිණුම			
13.1	කල් ඉකුත් වූ තැන්පත් සම්බන්ධයෙන් මු.රෙ 571 ප්‍රකාරව කටයුතු කර තිබුණේද? එවැනි තැන්පතු නොතිබුණේද?	ඔව්		
13.2	පොදු තැන්පත් ලේඛනය නඩත්තු කරමින් පවතීද?	ඔව්		
14	අග්‍රිම ගිණුම			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයට මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කළේද?	ඔව්		
14.2	මු.රෙ 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්යය අතුරු අග්‍රිම කාර්යය නිමවී මාසයක් ඇතුළත නිරවුල් කළේද? එසේ අග්‍රිම නිකුත් නොකළේද?	ඔව්		
14.3	මු.රෙ 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර නොතිබුණේද?	ඔව්		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය භාණ්ඩාගාරයේ පොත් සමඟ සසඳා අනාවරණය වූ වෙනස්කම් මාසිකව සසඳා තිබුණේද?	ඔව්		
15	ආදායම් ගිණුම			
15.1	අදාළ විධිවිධාන වලට අනුකූලව රැස්කළ ආදායම් ආපසු ගෙවා තිබුණේද?/ එසේ ආදායම් ආපසු ගෙවා නොතිබුණේද?	ඔව්		
15.2	රැස්කර තිබුණු ආදායම්, සෘජුවම ආදායමට බැරකර හෝ ඒවා තැන්පත් ගිණුමේ රඳවා ගෙන මාසයකට වඩා අඩු කාලයක් ඇතුළත ආදායම් ගිණුමට බැරකර හෝ තිබුණේද? එවැනි ආදායම් නොතිබුණේද?	ඔව්		
15.3	මු.රෙ 176 අනුව හිඟ ආදායම් පිළිබඳ තොරතුරු විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබේද?	ඔව්		
16	මානව සම්පත් කළමනාකරණය			
16.1	අනුමත සීමාව ඉක්මවා කාර්යය මණ්ඩලය අනුයුක්ත කර/බඳවා ගෙන තිබේද?	ඔව්		
16.2	කාර්යය මණ්ඩලයේ සියළුම සාමාජිකයින් වෙත ලිඛිත කාර්යය පැවරුම් කර තිබේද?	ඔව්		
16.3	2017.09.20 දිනැති අංක 04/2017 දරණ කළමනාකරණ සේවා චක්‍ර ලේඛය ප්‍රකාරව ආයතනයේ නිළධාරීන් බඳවා ගැනීම්, ඉල්ලා අස්වීම්, සේවය අතහැර යෑම්, සේවයෙන් පහ කිරීම්, විශ්‍රාම ගැන්වීම් හා මිය යාම් වැනි කරුණු හේතුවෙන් සිදුවන කාර්යය මණ්ඩලය වෙනස් වීම් අනුව යාවත්කාලීන කරන ලද කාර්යය මණ්ඩල තොරතුරු සෑම කාර්තුවක් අවසාන වී මාසයක් ඇතුළත කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කර තිබුණේද?	ඔව්		

අංකය	අදාල අවශ්‍යතාවය	අනුකූලතා තත්වය	අනුකූල නොවීම සඳහා පැහැදිලි කිරීම	නිවැරදි කිරීමේ ක්‍රියා
17	මහජනයා වෙත තොරතුරු ලබාදීම			
17.1	තොරතුරු දැනගැනීමේ පනත පනත ප්‍රකාරව මහජනයා වෙත අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුවට අදාළ තොරතුරු ලබාදීම සඳහා වගකිව යුතු නිලධාරියෙක් පත්කර තොරතුරු ලබාදීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වා තිබේද?			
17.2	මහජනයා විසින් ඉදිරිපත් කරනු ලබන පැමිණිලි භාරගැනීම, ලේඛන ගත කිරීමට ඒම පැමිණිලි සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ගය දැක්වෙන ලේඛනයක් යාවත්කාලීන කර පවත්වා තිබේද?			
17.3	තොරතුරු දැනගැනීමේ පනතේ 08 වන හා 10 වන ඡේද වලට අනුකූලව අර්ධ වාර්ෂිකව හා වාර්ෂිකව වාර්තා ඉදිරිපත් කර තිබේද?			
18	පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම			
18.1	2018.01.24 දිනැති අංක 05/2018 (1) දරණ චක්‍රලේඛයෙන් සංශෝධිත 2008.02.06 දිනැති අංක 05/2008 දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයෙන් හඳුන්වා දී ඇති පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියට අනුකූලව අමාත්‍යාංශ/දෙපාර්තමේන්තුව විසින් පුරවැසි/සේවා ලාභී ප්‍රඥප්තිය පිළියෙල කර ඒය ක්‍රියාත්මක කර තිබේද?	ඔව්		
18.2	චක්‍රලේඛයේ 2.3 ඡේදය ප්‍රකාරව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය පිළියෙල කිරීම සහ ක්‍රියාවට නැංවීමේ කටයුතු අධීක්ෂණය සහ ඇගයීම සඳහා අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව විසින් ඒ සඳහා ක්‍රමවේදයක් සකස් කර තිබේද?	ඔව්		
19	මානව සම්පත් සැලැස්ම පිළියෙල කිරීම			
19.1	2018.01.24 දිනැති අංක 02/2008 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ සඳහන් ඇමුණුම 02 ආකෘතිය පදනම් කර ගෙන මානව සම්පත් සැලැස්මක් පිළියෙල කර තිබේද?	නැත	මානව සම්පත් සැලැස්ම සකස් කරමින් පවතී.	
19.2	කාර්යය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ සහතික කර තිබේද?	ඔව්		
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 ආකෘතිය පදනම් කර ගෙන සමස්ථ කාර්යය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබේද?	නැත	කාර්ය සාධන ගිවිසුම සකස් කරමින් පවතී.	
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවිධානය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම පිළිබඳ වගකීම පවරා ජ්‍යෙෂ්ඨ නිළධාරියෙකු පත්කරන ලද්දේද?	ඔව්		
20	විගණන ඡේද			
20.1	ඉකුත් වර්ෂය සඳහා විගණකාධිපති විසින් නිකුත්කළ විගණන ඡේද වලින් පෙන්වා දී තිබුණු අඩුපාඩු නිවැරදි කර තිබුණේද? ඒවැනි විගණන ඡේද නොතිබුණේද?	ඔව්		